# පාර්ලිමේන්තු විත්ති

පුවත් හසුන | 24 වැනි කාණ්ඩය | ජුනි 2022



- පාර්ලිමේන්තු වාර්තාකරණයේ යෙදෙන මාධ්‍යවේදීන් සඳහා පාර්ලිමේන්තු ක්‍රමවේදය පිළිබඳ විශේෂ එක්දින වැඩමුලුවක්
- ආහාර අර්බුදය මැඩපැවැත්වීමට ක්‍රියාත්මක කළ හැකි කඩිනම් නිෂ්පාදන සැලසුම් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ අවධානයට

## පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබන මුද්‍රිත වාර්ෂික වාර්තා ඇතුළු ලේඛන මෘදු පිටපත් ලෙස පමණක් ප්‍රකාශයට පත් කිරීමේ තීරණයක්

මින් ඉදිරියට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබන වාර්ෂික වාර්තා, කාර්ය සාධන වාර්තා ඇතුලු ඊට අදාළ අනෙකුත් වාර්තා මෘදු පිටපත් (Soft Copies) මාර්ගයෙන් ප්‍රකාශයට පත් කිරීමට පසුගියදා රැස් වූ පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේදී තීරණය කළ බව කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා මේ මස පාර්ලිමේන්තුවේදී නිවේදනය කළේය...

සන්නිවේදන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව




# අන්තර්ගතය

පුවත්

කාරක සභා පුවත්

පාර්ලිමේන්තුවෙන් ඔබට...

විශේෂාංග

පාර්ලිමේන්තු ඡායා ගැලරිය

## පුවත්

- පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබන මුද්‍රිත වාර්ෂික වාර්තා ඇතුළු ලේඛන මෘදු පිටපත් ලෙස පමණක් ප්‍රකාශයට පත් කිරීමේ තීරණයක්
- පාර්ලිමේන්තු වාර්තාකරණයේ යෙදෙන මාධ්‍යවේදීන් සඳහා පාර්ලිමේන්තු ක්‍රමවේදය පිළිබඳ විශේෂ එක්දින වැඩමුලුවක්
- පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා සිය මන්ත්‍රීධුරයෙන් ඉල්ලා අස්වීමේ ලිපිය පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාට බාරදෙයි
- ධම්මික පෙරේරා මහතා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස දිවුරුම් දෙයි
- ශ්‍රී ලංකා විදුලි බල (සංශෝධන) ඇතුළු පනත් කෙටුම්පත් කිහිපයක් මෙරට නීති පද්ධතියට එක්වෙයි

## කාරක සභා පුවත්

- කොවිඩ් තත්ත්වයට වඩා වැඩි අභියෝගයක් ආර්ථික අර්බුදය හමුවේ අධ්‍යාපන ක්ෂේත්‍රයට මුහුණ දෙන්න සිදුවෙලා - අධ්‍යාපන ලේකම්වරයා කෝපා කමිටුව හමුවේ පවසයි.
- එතනෝල් ආනයනය සඳහා බලපත්‍ර ලබාදීමේ ක්‍රමවේදය රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සංවාදයට
- ආහාර අර්බුදය මැඩපැවැත්වීමට ක්‍රියාත්මක කළ හැකි කඩිනම් නිෂ්පාදන සැලසුම් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ අවධානයට
- රුපියල් මිලියන 3100ක් වැය කොට මිලදී ගත් විදුලි ජනක යන්ත්‍ර 50 ක් මිලදී ගන්නා විට ක්‍රියාකාරී තත්ත්වයේ නොපැවතීම පිළිබඳ කෝප් කමිටුවේ අවධානය
- මැතිවරණ සහ ඡන්ද විමසීම් ව්‍යුහයේ හා නීති රීතිවල ප්‍රතිසංස්කරණ හඳුනාගැනීමටත්, ඒ සම්බන්ධයෙන් අවශ්‍ය සංශෝධන ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේ අවසන් වාර්තාව පාර්ලිමේන්තුවට.
- ආණ්ඩුවේ බදු ප්‍රතිපත්ති වෙනස් වීමට වඩා වාහන ආනයනය නැවතීම ඇතුළු කොවිඩ් තත්ත්වය රටේ ආර්ථික බිඳවැටීමට හේතු වුණා මුදල් අමාත්‍යාංශයේ හිටපු ලේකම් එස්. ආර්. ආටිගල
- හම්බන්තොට වරාය 99 වසරකට බදුදීමෙන් ගත් මුදලින් වරාය ඉදිකිරීමට ගත් ණය ගෙවා නැහැ - කෝප් කමිටුවේදී අනාවරණය වෙයි.
- ගිවිසුම් හා බැඳුම්කර කඩ කළ මොරටුව විශ්ව විද්‍යාලයේ ආචාර්යවරුන්ගෙන් අයවිය යුතු මුදල රුපියල් 51,649,961ක් කෝප් කමිටුවේදී අනාවරණය වෙයි.
- රුපියල් බිලියන 695ක පරිපූරක ඇස්තමේන්තුවට රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ අනුමතිය

## පාර්ලිමේන්තුවෙන් ඔබට...

- ශිෂ්‍ය පාර්ලිමේන්තු වැඩසටහන භාර සම්බන්ධීකරණ නිලධාරීන් දැනුවත් කෙරේ

## විශේෂාංග

- 1972 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව යටතේ ජාතික රාජ්‍ය සභාව
- එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ව්‍යුහය සහ කාර්යභාරය




# පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබන මුද්‍රිත වාර්ෂික වාර්තා ඇතුළු ලේඛන මෘදු පිටපත් ලෙස පමණක් ප්‍රකාශයට පත් කිරීමේ තීරණයක්

මින් ඉදිරියට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබන වාර්ෂික වාර්තා, කාර්යසාධන වාර්තා ඇතුලු ඊට අදාළ අනෙකුත් වාර්තා මෘදු පිටපත් (Soft Copies) මාර්ගයෙන් ප්‍රකාශයට පත් කිරීමට පසුගියදා රැස් වූ පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේදී තීරණය කළ බව කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා මේ මස පාර්ලිමේන්තුවේදී නිවේදනය කළේය.

රටේ දැනට පවතින දැඩි ආර්ථික අර්බුදකාරී තත්ත්වය පිළිබඳ විශේෂ අවධානය යොමුකොට වියදම් සීමා කිරීමේ පියවරක් ලෙස මෙන්ම, ඇතිවිය හැකි පාරිසරික ගැටලු ද අවම කිරීමේ අරමුණින් මෙම තීරණය ගත් බවත් මේ සම්බන්ධයෙන් සියලු මන්ත්‍රීවරයන්ගේ සහයෝගය බෙහෙවින් අගය කරන බවත් කථානායකවරයා පැවසීය.

තවද මුද්‍රිත කටයුතු සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය සපයා ගැනීමේ දී පවතින දුෂ්කරතාවය, එලෙසම දැනට භාවිත කරන ආනයනික සංයුක්ත තැටි වෙළෙඳපොළෙන් සොයාගැනීමට ඇති අපහසුතාවය සහ ඒ සඳහා ඉතා අධික මිලක් දැරීමට සිදුවීම, එලෙසම සංයුක්ත තැටි ප්‍රතිචක්‍රීකරණයේ දී පරිසරයට මුදා හැරීමේ දී ඇතිවන අහිතකර පාරිසරික බලපෑම් පිළිබඳව කාරක සභාවේ විශේෂ අවධානය යොමු වූ බවද කථානායකවරයා පැවසීය.

**අදාළ වාර්තා මන්ත්‍රීවරුන් වෙත විද්‍යුත් තැපෑල මඟින් යොමු කිරීමට පියවර..**

**මෘදු පිටපත් පාර්ලිමේන්තු වෙබ් අඩවියේ විශේෂිත වෙබ් පෝටලයකට (web portal) ඇතුළත් කෙරේ...**

**වාර්තාවල දෘඪ පිටපත් කිහිපයක් අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන කාරක සභාවල පරිශීලනය කිරීමට හා පුස්තකාලයේ තැබීමට පියවර...**

මේ අනුව මේ සම්බන්ධ කටයුතු කිරීමට නිලධාරියකු පත්කොට අදාළ දිනවල දී සභාගත කරනු ලබන එකී වාර්තාවල මෘදු පිටපත් (Soft Copies) ගරු මන්ත්‍රීවරුන් වෙත විද්‍යුත් තැපෑල මඟින් යොමු කිරීමට (ඊමේල්) මෙහිදී තීරණය වී ඇත.

එලෙසම දෛනිකව සභාගත කරනු ලබන වාර්තා ආදිය ලැප්ටොප් /ඩෙස්ක්ටොප් පරිගණක, ටැබ් හෝ

ජංගම දුරකථන මඟින් පරිශීලනය කිරීමට හැකිවනු පිණිස මෘදු පිටපත් ලෙස පාර්ලිමේන්තු වෙබ් අඩවියේ විශේෂිත වෙබ් පෝටලයකට (web portal) ඇතුළත් කිරීමට මෙහිදී තීරණය වූ බවද කථානායකවරයා නිවේදනය කළේය. තවද එකී වාර්තාවල දෘඩ පිටපත් කිහිපයක් අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන කාරක සභාවල පරිශීලනය කිරීමට හා පුස්තකාලයේ තැබීමට පියවර ගන්නා බවද කථානායකවරයා පැවසීය. ඒ අනුව මේ සම්බන්ධව සියලුම අමාත්‍යාංශවල ලේකම්වරුන් දැනුවත් කොට එම වැඩපිළිවෙළ කඩිනමින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන බවද මහින්ද යාපා අබේවර්ධන මහතා පවසා සිටියේය.

**පුවත්**

# පාර්ලිමේන්තු වාර්තාකරණයේ යෙදෙන මාධ්‍යවේදීන් සඳහා පාර්ලිමේන්තු ක්‍රමවේදය පිළිබඳ විශේෂ එක්දින වැඩමුලුවක්

**පාර්ලිමේන්තු වාර්තාකරණයේ යෙදෙන මාධ්‍යවේදීන් සඳහා පාර්ලිමේන්තු ක්‍රමවේදය පිළිබඳ විශේෂ වැඩමුලුවක් මේ මස පැවැත්විණි.**





පාර්ලිමේන්තුව, ජනමාධ්‍ය සහ මහජනතාව අතර වඩාත් ශක්තිමත් සහසම්බන්ධයක් ගොඩනැගීම අරමුණු කරමින් පැවති මෙම වැඩමුළුව සඳහා පාර්ලිමේන්තු වාර්තාකරණයේ යෙදෙන සියලුම මාධ්‍ය ආයතන නියෝජනය කරන මාධ්‍යවේදීහු සහභාගී වූහ.

කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් පෙ.ව. 8.30ට වැඩමුලුව ආරම්භ විය. මෙහිදී පාර්ලිමේන්තු මාධ්‍යවේදීන් අමතමින් කථානායකවරයා ප්‍රකාශ කළේ නීති සම්පාදනය කරන උත්තරීතර ආයතනය වන පාර්ලිමේන්තුව හා සබැඳි වාර්තාකරණයේදී වඩාත් නිවැරදි තොරතුරු සමාජගත කිරීමෙහිලා සුවිසල් වගකීමක් පාර්ලිමේන්තු මාධ්‍යවේදීන්ට ඇති බවයි.

මෙහිදී ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීම සඳහා පාර්ලිමේන්තුව, මාධ්‍ය සහ මහජනතාව අතර සම්බන්ධතාවය ගොඩනැගීම පිළිබඳ පාර්ලිමේන්තුවේ මහ ලේකම් ධම්මික දසනායක මහතා විසින් පැහැදිලි කරන ලදි. එසේම පාර්ලිමේන්තු මහ ලේකම් කාර්යාලය, පාර්ලිමේන්තු ස්ථාවර නියෝග සහ පාර්ලිමේන්තු වරප්‍රසාද පිළිබඳව පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩල ප්‍රධානී සහ නියෝජ්‍ය මහලේකම් කුෂානි රෝහනදීර මහත්මිය සිය දේශනය ඉදිරිපත් කළාය.

පාර්ලිමේන්තු කමිටු ක්‍රමය පිළිබඳ පාර්ලිමේන්තුවේ සහකාර මහ ලේකම් ටිකිරි කේ. ජයතිලක මහතා විසින් පැහැදිලි කළ අතර නීති සම්පාදන ක්‍රියාවලිය පිළිබඳව සහ පාර්ලිමේන්තු භාෂාවේ සුවිශේෂතා පිළිබඳව පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායක සේවා අධ්‍යක්ෂ සහ සන්නිවේදන අධ්‍යක්ෂ (වැඩබලන) එච්.ඊ.ජනකාන්ත සිල්වා මහතා විසින් පැමිණ සිටි මාධණවේදීන් දැනුවත් කරන ලදී.

පාර්ලිමේන්තුවේ පවතින ඩිජිටල් අවකාශය භාවිත කිරීම පිළිබඳව පාර්ලිමේන්තුවේ තොරතුරු පද්ධති කළමනාකරණ අධ්‍යක්ෂ මහේෂ් පෙරේරා මහතා පැහැදිලි කළේය. තවද වේත්‍රධාරී දෙපාර්තමේන්තුව සමඟ කටයුතු කිරීමේදී මාධ්‍යවේදීන්ට වැදගත්වන කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ වේත්‍රධාරී නරේන්ද්‍ර ප්‍රනාන්දු මහතා සිය දේශනය ඉදිරිපත් කළේය.

පාර්ලිමේන්තු වාර්තාකරණයේදී මාධ්‍යවේදීන්ට මුහුණපෑමට සිදුවන ගැටලු සහ ඒවාට ලබාදිය හැකි විසඳුම් පිළිබඳව ද මෙහිදී සාකච්ඡා විය.

එසේම මෙම වැඩසටහන සඳහා පාර්ලිමේන්තුවේ සම්බන්ධීකරන ඉංජිනේරු ලලිත් අධිකාරී මහතාද සහභාගී විය.

මෙම වැඩසටහන පාර්ලිමේන්තුවේ මහ ලේකම් කාර්යාලය විසින් සංවිධානය කළ අතර එන්. ඩී. අයි. ආයතනය (National Democratic Institute) මේ සඳහා අනුග්‍රාහකත්වය සැපයීය.



පුවත්

# පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා සිය මන්ත්‍රීධූරයෙන් ඉල්ලා අස්වීමේ ලිපිය පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාට බාරදෙයි.

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා සිය පාර්ලිමේන්තු මන්ත්‍රීධූරයෙන් ඉල්ලා අස්වීමේ ලිපිය පාර්ලිමේන්තුවේ මහ ලේකම් ධම්මික දසනායක මහතාට මේ මස බාර දුනනේය.

ඒ මහතා 2021 වසරේ ජූලි මස 08 වන දින පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ නියෝජනය කරමින් ජාතික ලැයිස්තුවෙන් නව වැනි පාර්ලිමේන්තුවට තේරී පත් විය. අනතුරුව ඔහු මාස කිහිපයක් මුදල් අමාත්‍යවරයා ලෙසද කටයුතු කළේය.

බැසිල් රෝහණ රාජපක්ෂ මහතා මෙයට පෙර දෙවරක් පාර්ලිමේන්තුව නියෝජනය කර තිබේ.





පුවත්

# ධම්මික පෙරේරා මහතා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස දිවුරුම් දෙයි


ධම්මික පෙරේරා මහතා ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ජාතික ලැයිස්තු මන්ත්‍රීවරයෙක් වශයෙන් කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා ඉදිරියේ මේ මස දිවුරුම් දුන්නේය.

කථානායකවරයා ඉදිරියේ දිවුරුම්දීමෙන් පසු ඒ මහතා  මහ ලේකම් ධම්මික දසනායක මහතා ඉදිරියේදී මන්ත්‍රී නාමලේඛනයේ අත්සන් තැබීය.

හිටපු අමාත්‍ය බැසිල් රාජපක්ෂ මහතා ඉල්ලා අස්වීමෙන් ඇතිවූ පුරප්පාඩුව සඳහා ධම්මික පෙරේරා මහතා මෙලෙස පත්විය.

1967 දෙසැම්බර් 28 වැනි දින කළුතර කටුකුරුන්දේදී උපත ලබා ඇති ඒ මහතා හොරණ තක්ෂිලා විද්‍යාලයේ ආදි ශිෂ්‍යයෙකි. එසේම ධම්මික පෙරේරා මහතා මොරටුව විශ්ව විද්‍යාලයේ ජාතික තාක්ෂණික ඩිප්ලෝමාධාරියෙක්ද (NDT) වේ.









# ශ්‍රී ලංකා විදුලි බල (සංශෝධන) ඇතුළු පනත් කෙටුම්පත් කිහිපයක් මෙරට නීති පද්ධතියට එක්වෙයි

**මෙම මස පාර්ලිමේන්තුවේදී සම්මත වූ පනත් කෙටුම්පත් කිහිපයක කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා සිය සහතිකය සටහන් කළේය.**

ශ්‍රී ලංකා විදුලි බල (සංශෝධන), කාර්මික ආරවුල් (විශේෂ විධිවිධාන), අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) සහ සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත් සඳහා මෙලෙස කථානායකවරයාගේ සහතිකය හිමිවිය.

2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත සංශෝධනය කිරීම සඳහා වූ ශ්‍රී ලංකා විදුලි බල (සංශෝධන) පනත් කෙටුම්පත පසුගිය ජූනි 9 වැනිදා පාර්ලිමේන්තුවේදී වැඩි ඡන්දයෙන් සංශෝධන රහිතව සම්මත විය.

යම් තැනැත්තකුට විදුලිබලය උත්පාදනය කිරීම පිණිස උත්පාදනය කිරීමේ බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලබා දීම මෙමගින් සිදුවේ.මෙම සංශෝධනය මඟින් යම් තැනැත්තෙකුට උත්පාදන ධාරිතාව මෙගාවොට් 25 ඉක්මවා සහ අභිබවා විදුලිබලය උත්පාදනය කිරීමේ බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා ඉල්ලුම් කිරීමට ඇති සීමා ඉවත් කිරීම සහ උත්පාදන ධාරිතාව පිළිබඳ යම් සීමා නියම කිරීමකින් තොරව ඕනෑම තැනැත්තකුට ඒ සඳහා ඉල්ලුම් කිරීමට අවසර ලබාදීම සිදුවනු ඇත.

කම්කරු ආරවුල් විසඳීමේදී මහේස්ත්‍රාත් අධිකරණවල පවතින තදබදය අවම කිරීම සඳහා කම්කරු විනිශ්චය අධිකාරිවල සභාපතිවරයන් අතිරේක මහේස්ත්‍රාත්වරයන් ලෙස සැලකීම හා ඒ හා සබැඳි කරුණු සඳහා විධිවිධාන සැලසීම කාර්මික ආරවුල් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත මඟින් අපේක්ෂා කෙරේ.

අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත මඟින් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 442 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර නඩුවක එක් එක් පාර්ශවයකට නඩු තීන්දුවේ හෝ නඩු වාර්තාවේ අවසාන ආඥාවේ එක් සහතික පිටපතක් ගාස්තු අය කිරීමෙන් තොරව ලබා දීම සිදුවේ.

සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත මඟින් සිවිල් නඩු විධාන සංග්‍රහය පනතට 154(අ) නව වගන්තිය ඇතුළත් කරනු ලබන අතර යම් නීති කෘත්‍යයන්හීදී ඇතැම් ලේඛන විධිමත් ඔප්පු කිරීමෙන් නිදහස් කිරීම සිදුවේ.

ඒ අනුව මෙම පනත් කෙටුම්පත් 2022 අංක 16 දරන ශ්‍රී ලංකා විදුලි බල (සංශෝධන), 2022 අංක 17 දරන සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන), 2022 අංක 18 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) සහ 2022 අංක 19 දරන කාර්මික ආරවුල් (විශේෂ විධිවිධාන) පනත් ලෙස මෙරට නීති පද්ධතියට එක්විය.

# කාරක සභා පුවත්














# කොවිඩ් තත්ත්වයට වඩා වැඩි අභියෝගයක් ආර්ථික අර්බුදය හමුවේ අධ්‍යාපන ක්ෂේත්‍රයට මුහුණ දෙන්න සිදුවෙලා

## - අධ්‍යාපන ලේකම්වරයා



■ විභාග ප්‍රශ්න පත්‍ර සැකසීමේදී අහිමි වූ ඉගෙනුම් කාලය පිළිබඳවද විශේෂ අවධානය යොමුකරන ලෙස නිර්දේශ

■ දුෂ්කරතා මධ්‍යයේ වුවද අධ්‍යාපන ක්ෂේත්‍රය පවත්වාගෙන යාමට කටයුතු කිරීම පිළිබඳ කමිටුවේ ඇගයීමට

■ 2020 වසරේදී සිසු දරුවන්ගේ ඉගෙනුම් අහිමිවීම 54% ක් ලෙස ද 2021 අගෝස්තු වන විට 88% ක් ලෙස ද ගණන් බලා ඇති බව ද අනාවරණය වෙයි

සමස්තයක් ලෙස ගත් විට අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉතා බැරෑරුම් හා සංකීර්ණ ක්‍රියාවලියකට අවතීර්ණවීමට සිදුව ඇති බවත් කොවිඩ් තත්ත්වයටත් වඩා ආර්ථික අර්බුදය හමුවේ උද්ගතව ඇති තත්ත්වය කළමනාකරණය කර ගැනීම අපහසුව ඇති බවත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් එම්. එන් රණසිංහ මහතා පසුගිය ජුනි 15 වැනිදා පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේදී (කෝපා කමිටුව) පැවසීය.

පැවති කොවිඩ් තත්ත්වය සහ ආර්ථික අර්බුදය හමුවේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉදිරි සැලසුම් පිළිබඳ විමසා බැලීම සඳහා මහාචාර්ය තිස්ස විතාරණ මහතාගේ ප්‍රධානත්වයෙන් රැස්වූ කෝපා කමිටුව හමුවට අධ්‍යාපන බලධාරීන් කැඳවූ අවස්ථාවේදී අධ්‍යාපන ලේකම්වරයා මේබව පැවසීය.

අධ්‍යාපන අමාත්‍යාංශය, ජාතික අධ්‍යාපන ආයතනය, විභාග දෙපාර්තමේන්තුව, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යන ආයතනවල නිලධාරීහු මෙම විශේෂ රැස්වීමට කැඳවා තිබිණි.

නියමිත දින ගණන පාසැල් පැවැත්වීමට නොහැකිවීම නිසා පවතින සීමිත කාලසීමාව තුළ විෂය නිර්දේශය ආවරණය කිරීමට නොහැකිවීම, පවතින ඉන්ධන හිඟය, දරුවන්ගේ පවුලේ ආර්ථික අපහසුතා, දෙමාපියන්ට රැකියා අහිමිවීම ආදිය බරපතල ගැටලුවක් වෙමින් පවතින බව ලේකම්වරයා පෙන්වා දුන්නේය. මාර්ගගත තාක්ෂණය ඔස්සේ ඉගැන්වීම් සිදු කළද ග්‍රාමීය වශයෙන් විවිධ දුෂ්කරතා පවතින බවත් ඉගෙනුම් ක්‍රියාවලියේදී මාර්ගගත ක්‍රමය දීර්ඝකාලීනව සිදුකිරීම සිසු දරු දැරියන් සඳහා සාර්ථක ක්‍රමයක් නොවන බවත් මෙහිදී නිලධාරීහු පෙන්වා දුන්හ.

ඇතිවී ඇති ආර්ථික අර්බුදකාරී තත්ත්වය තුළ අධ්‍යාපන අමාත්‍යාංශයට මීට පෙර වෙන් වූ වැය ශීර්ෂයන්ට අයත් මුදල් ප්‍රමාණවත් නොවීම තවත් ප්‍රධාන ගැටලුවක් බවත් රජයේ මුදල් ප්‍රභවයන්ට පරිබාහිරව වෙනත් ආයතනවලින් ලැබීමට ඇති UNICEF, ADB, ලෝක බැංකුව වැනි ව්‍යාපෘතිවල මුදල් ප්‍රතිව්‍යුහගත කර ප්‍රමුඛතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා යෙදවීමට කටයුතු කරන බවත් මෙහිදී ලේකම්වරයා පැවසීය.

සීමිත කාලයක පාසැල් පැවැත්වීම නිසා සම්පූර්ණ විෂය නිර්දේශය ආවරණය කිරීමට නොහැකි තත්ත්වයක විභාගයට අදාළ කරගන්නා විෂය නිර්දේශයේ වපසරිය සීමා කිරීමේ අවශ්‍යතාව පිළිබදවද කමිටුවේ විශේෂ අවධානය යොමුවිය. එසේ නොවන විට දරුවන් මෙන්ම ගුරුවරුන්ද දැඩි පීඩනයකට ලක්වන බව කමිටුව පෙන්වා දුන්නේය.

2020 වසරේදී සිසු දරුවන්ගේ ඉගෙනුම් අහිමිවීම  54% ක් ලෙස සහ 2021 අගෝස්තු






වන විට 88%ක් ලෙස ගණන් බලා ඇති බව ද මෙහිදී අනාවරණය විය. මෙවැනි තත්ත්වයක් තුළ විභාග දෙපාර්තමේන්තුවෙන් විභාග පැවැත්වමේදී අදාළ ඉගෙනුම් අහිමිවීම පිළිබඳ සලකා බලා දරුවන්ට අසාධාරණයක් නොවන ලෙස ප්‍රශ්න පත්‍ර සැකසීමේ අවශ්‍යතාව කමිටුව අවධාරණය කළේය. ඒ සඳහා ජාතික අධ්‍යාපන ආයතනය, අධ්‍යාපන අමාත්‍යාංශය හා විභාග දෙපාර්තමේන්තුව මනා සම්බන්ධීකරණයෙන් මේ සඳහා ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන ක්‍රියාත්මක කරන ලෙස කමිටුව මෙහිදී නිර්දේශ කළේය.

එසේම පවතින ප්‍රවාහන දුෂ්කරතා හේතුවෙන් ළඟම පාසැලට දරුවන් තාවකාලිකව අනුයුක්ත කිරීමේ ක්‍රමවේදයක් සකස් කරන බවත් එය මෙම වසරේ දෙසැම්බර් 31 දක්වා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන බවත් මෙහිදී අනාවරණය විය.

මෙහිදී පවතින දැඩි දුෂ්කරතා මධ්‍යයේ වුවද සාමාන්‍ය පෙළ ඇතුළු ජාතික විභාග නිසි පරිදි පැවැත්වීමට කටයුතු කිරීම පිළිබඳ විභාග කොමසාරිස් ජනරාල් ඇතුළු සියලු නිලධාරීන් කමිටුවේ ප්‍රශංසාවට ලක්විය. එසේම කොවිඩ් තත්ත්වය තුළ මෙන්ම ආර්ථික අර්බුදය හමුවේ අධ්‍යාපන ක්ෂේත්‍රය නිසි පරිදි පවත්වා ගැනීමට කටයුතු කළ සියලු ගුරුවරු ඇතුළු අධ්‍යාපන බලධාරීන්ටද කමිටුව සිය ප්‍රශංසාව පුද කළේය.

පැවති කොවිඩ් තත්ත්වය සහ වත්මන් ආර්ථික අර්බුදය හමුවේ විශ්ව විද්‍යාල පද්ධතියේ පවතින ගැටලු පිළිබඳවද මෙහිදී සාකච්ඡා විය. පවතින ඉන්ධන හා ගෑස් හිඟය වැනි දුෂ්කරතා හමුවේ තවදුරටත් ප්‍රායෝගික පරීක්ෂණ යනාදිය සඳහා පමණක් විශ්ව විද්‍යාලවලට කැඳවීම සිදු කරන බවත් මාර්ගගත ක්‍රමය ඔස්සේ දේශන පැවැත්වෙන බවත් මෙහිදී නිලධාරීහු පැවසූහ.

ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක ඩොලර් මිලියන 100ක ව්‍යාපෘතිය නැවත සළකා බලා පවතින අර්බුදය හමුවේ ඵලදායි ලෙස යොදා ගැනීමට සැලසුම් සකස් කරන ලෙස මෙහිදී කමිටුව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට නිර්දේශ කළේය.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් වන ගරු දයාසිරි ජයසේකර, ගරු ලසන්ත අලගියවන්න, ගරු මොහොමඩ් මුසම්මිල්, ගරු තිස්ස අත්තනායක, ගරු (වෛද්‍ය) සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ, ගරු ශිවඥානම් ශ්‍රීතරන්, ගරු ප්‍රසන්න රණවීර, ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය, ගරු වීරසුමන වීරසිංහ සහ ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති යන මහත්ම මහත්මීහු මෙම අවස්ථාවට එක්ව සිටියහ.



# එතනෝල් ආනයනය සඳහා බලපත්‍ර ලබාදීමේ ක්‍රමවේදය රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සංවාදයට





**මෙරට භාවිතය සඳහා ආනයනය කරන එතනෝල් ප්‍රමාණය පිළිබඳව සහ ආනයනය කරනු ලබන ආයතන පිළිබඳව නිසි පරිදි නියාමනයක් සිදු නොවීම පිළිබඳව මේ මස පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ විශේෂ අවධානයට ලක්විය.**

විවිධ සමාගම් සඳහා මෙරටට එතනෝල් ආනයනය කිරීම සඳහා බලපත්‍ර නිකුත් කරන ක්‍රමවේදය, එම එක් එක් සමාගම් පිළිබඳ තොරතුරු, එම සමාගම් ආනයනය කරනු ලබන එතනෝල් ප්‍රමාණය පිළිබඳ තොරතුරු ඇතුළත් වාර්තාවක් දෙසතියක් තුළ කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තු නිලධාරින් වෙත දන්වා සිටින ලදි. එමෙන්ම, මත්පැන් නිෂ්පාදනය හැරුණු විට ඖෂධ ඇතුළු වෙනත් නිෂ්පාදන සඳහා එතනෝල් ආනයනය කර ඇති ප්‍රමාණය සහ නිසි පරිදි එම එතනෝල් එකී නිෂ්පාදන සඳහා පමණක් භාවිත කරන්නේද යන්න පිළිබඳවද අවධානය යොමු කරන ලෙස අවධාරණය කරන ලදී.

තවද, ශ්‍රී ලංකාවට වාහන සහ වාහන අමතර කොටස් ආනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳව කාරක සභාව විසින් විමසා සිටි අතර, ඒ සඳහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණයෙන් යුතුව නිසි ක්‍රමවේදයක් සකස් කිරීමට අවශ්‍ය පියවර ගැනීමට මින් පෙරද උපදෙස් ලබා දී තිබුණද, ඊට අදාළ ක්‍රියාමාර්ග ගෙන නොතිබීම පිළිබඳව කාරක සභාවේ අප්‍රසාදය පළවිණි මීට අමතරව ඊට අදාළ කටයුතු සකස් කර වඩා කාර්යක්ෂම හා විනිවිදභාවයකින් යුතුව පවත්වාගෙන යාමට සුදුසු ක්‍රමවේදයක් සකසා මාස 04 කාලයක් ඇතුළත කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස වැඩිදුරටත් දන්වා සිටින ලදී.

ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ කටයුතු පවත්වාගෙන යාමට නිසි ප්‍රමිතියකින් යුතු පරිගණක පද්ධතියක් නොමැති වීම පිළිබඳවද කාරක සභාවේ විශේෂ අවධානයට ලක්විණි. දෙපාර්තමේන්තුවේ කටයුතු පවත්වාගෙන යාමේදී, සුරාබදු දෙපාර්තමේන්තුව, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව ආදී සෘජුවම සම්බන්ධ වන ආයතන සමඟ මනා සම්බන්ධීකරණයක් නොමැති වීම ඉතාමත් ගැටලුසහගත බව කාරක සභාව විසින් පෙන්වා දුන් අතර, පරිගණක ජාලගතකරණය වහා සිදු කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස දැනුම් දෙන ලදී.

ඒ සඳහා, ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA), විදුලි සන්දේශ නියාමන කොමිෂන් සභාව වැනි ආයතන සමඟ සහසම්බන්ධ වීමේ වැදගත්කමද අවධාරණය කෙරිණි. මෙම කාරණය පිළිබඳව 2016 වර්ෂයේදීද ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් දැනුවත් කර තිබුණද මේ දක්වා එම කාර්යය සිදු නොවීම පිළිබඳව කාරක සභාව අප්‍රසාදය පළ කළ අතර, මෙහි ඇති වැදගත්කම සලකා එහි ප්‍රගතිය පිළිබඳව විමර්ශනය සඳහා අනුකමිටුවක් පත් කිරීමටද කාරක සභා සභාපතිවරයා විසින් තීරණය කරන ලදී.

තවද, ත්‍යාග ක්‍රමය යටතේ ආනයනය කරනු ලබන වාහන පසුකාලීනව විවිධ පාර්ශ්ව වෙත පැවරීම පිළිබඳවද මෙහිදී අවධානයට ලක්විණි. ඒ අනුව, ත්‍යාග ක්‍රමයට වාහන ආනයනය කිරීමෙන් පසු එම වාහන වෙනත් පාර්ශ්ව වෙත ලබා දීම පිළිබඳව පැමිණ සිටි නිලධාරීන්ගෙන් විමසා සිටින ලදී. බදු සහන පදනමක් මත එසේ ගෙන්වන වාහන වසර 05ක් ගත වනතුරු වෙනත් පාර්ශවයක් වෙත පැවරීම සිදු කළ නොහැකි බව එම නිලධාරීහු කාරක සභාවට දැන්වූ අතර, වසර 05කින් පසු එසේ පැවරීම් සිදු කිරීමකදී වුවද අදාළ වාහන සඳහා පවතින සාමාන්‍ය බදු අගයම අය කර

ගැනීම සඳහා අවශ්‍ය ක්‍රමවේදය සකසා ඇති බව ප්‍රකාශ කළහ. එමෙන්ම, ත්‍යාග ක්‍රමය යටතේ ගෙන්වන වාහන සඳහා බලපත්‍ර නිකුත් කිරීමෙන් පසුව නිසි පරිදි පසුවිපරමකට ලක් කිරීම හා නියාමනයේ වැදගත්කම කාරක සභාව විසින් අවධාරණය කෙරිණි.

2015 සැප්තැම්බර් 21 දිනැති අංක 1933/13 දරන ගැසට් පත්‍රයේ ප්‍රතිපාදනවලට, බලපත්‍ර පාලනයට යටත් කරන ලද වාහන සඳහා වන ගැසට් නිවේදනවලට හා සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ අමාත්‍යවරයා හා රාජ්‍ය අමාත්‍යවරයා විසින් ආනයන අපනයන පාලකවරයා වෙත දෙන ලද උපදෙස්වලට පරිබාහිරව 2017 වර්ෂයේ පාවිච්චි කළ මෝටර් කාර් රථ 33 ක් වැරදි රේගු සංයෝජිත වර්ගීකරණය අංකනය හේතුවෙන් රු. මිලි.114.6 ක රේගු බදු අහිමි වීම පිළිබඳව කාරක සභාව විසින් විමසන ලදී. ඒ අනුව ඒ පිළිබඳ පූර්ණ පරීක්ෂණ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පවරා ඇති බව දන්වන ලදී. එහි ප්‍රගතිය පිළිබඳව වාර්තාවක් සති 02ක් තුළ කාරක සභාවට ඉදිරිපත් කරන ලෙසද කාරක සභා සභාපතිවරයා දැන්වීය.

එමෙන්ම, සීනි කිලෝග්‍රෑමයක් සඳහා පනවා තිබුණු විශේෂ භාණ්ඩ බදු රු.50 සිට ශත.25ක් දක්වා අඩු කිරීම මඟින් බලාපොරොත්තු වූ සහනය පාරිභෝගික ජනතාවට නොලැබීම පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා වූ විශේෂ විගණන වාර්තාව පිළිබඳවද පසුගියදා කාරක සභාව තුළ සංවාදයට ලක්විණි. සීනි ආනයනය කිරීම සඳහා බලපත්‍ර ක්‍රමයක් හඳුන්වා දීම හා සීනි ආනයනය පාලනය කිරීමට අවශ්‍ය නිර්ණායක හඳුන්වාදීමට කටයුතු නොකිරීම, බලපත්‍ර නිකුත් කිරීම ප්‍රමාද වීමෙන් රජයට සිදු වූ පාඩුව පිළිබඳව මෙම මස 21 වන දින කාරක සභාවේදී සංවාදයට ගැනීම නියමිත බවද මෙහිදී වැඩිදුරටත් අවධාරණය කෙරිණි.



# ආහාර අර්බුදය මැඩපැවැත්වීමට ක්‍රියාත්මක කළ හැකි කඩිනම් නිෂ්පාදන සැලසුම් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ අවධානයට



**වර්තමාන ලෝක වෙළඳපොළ තත්ත්වයන් සහ දේශීය ආර්ථික අර්බුදය හමුවේ රට තුළ උද්ගතවිය හැකි යැයි අනුමාන කරන ආහාර අර්බුදය මැඩපැවැත්වීමට ක්‍රියාත්මක කළ හැකි කෙටිකාලීන සහ දිගුකාලීන නිෂ්පාදන සැලසුම් පිළිබඳව ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී මහාචාර්ය තිස්ස විතාරණ මහතාගේ සභාපතීත්වයෙන් මේ මස පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේදී සාකච්ඡාවට භාජනය කරන ලදී.**

මෙම වසර සඳහා අවශ්‍ය කරන සහල් ප්‍රමාණයෙන් වැඩි ප්‍රමාණයක් මෙම කන්නයේ වී අස්වැන්නෙන් ලබා ගැනීමට හැකිවේවි යැයි ඇස්තමේන්තු කර ඇති බවත්, ඉතිරි ප්‍රමාණය සපයා ගැනීමට අවශ්‍ය කඩිනම් ක්‍රියාමාර්ග ගන්නා ලෙස වෙළඳ අමාත්‍යාංශයට දැනුම් දී ඇති බවත් මෙහිදී අනාවරණය විය. තවද, සහල් සහ අනෙකුත් ආහාර බෝග සඳහා භාවිත කරන පොහොර සහ කෘෂි රසායනික ද්‍රව්‍ය ආනයනය කිරීමට අවශ්‍ය මූල්‍ය පහසුකම් ඉක්මනින් සලසා දෙන ලෙස ද අදාළ අංශ දැනුවත් කරන බව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව(කෝපා) විසින් කෘෂිකර්ම අමාත්‍යාංශයීය නිලධාරීන්ට දැනුම් දෙන ලදී.

එසේම, යම් සුවිශේෂී තත්ත්වයන් යටතේ සහල් පරිභෝජනය ඉහළ යා හැකි බැවින් සහල් සඳහා ආදේශක ලෙස මෙන්ම කෙටිකාලීනව අස්වනු ලබා ගත හැකි විකල්ප බෝග වගාවන් සඳහා ක්‍රියාත්මක සැලසුම් කවරේද යන්න පිළිබඳවද මෙහිදී කාරක සභාව විසින් ප්‍රශ්න කරන ලදී. ඒ සඳහා එක් වැඩසටහනක් ලෙස "එක්ව වවමු - රට දිනවමු" කඩිනම් ආහාර නිෂ්පාදන

වැඩ පිළිවෙළ රට පුරා ක්‍රියාත්මක කිරීමට සැලසුම් යොදා ඇති බවත්, එය මෙම මස 15 වැනිදා සිට ක්‍රියාවට නංවන බවද අනාවරණය විය. එසේම මෙම වැඩසටහන් නිසි පරිදි ක්‍රියාත්මක වන්නේද යන්න පිළිබඳව නියාමනයට ලක් කරන ලෙසද කාරක සභාව නිලධාරීන්ට දන්වා සිටියේය.

මෙහිදී කාරක සභාව විසින් අමාත්‍යාංශයීය නිලධාරීන් හමුවේ අවධාරණය කර සිටියේ, පවතින තොරතුරුවල නිරවද්‍යතාවය පිළිබඳව ගැටලු පවතින නිසා, මෙම දත්ත මත පදනම්ව නිවැරදි ආර්ථික සැලසුම් සකස් කළ නොහැකි බැවින්, ප්‍රාදේශීය නිලධාරීන් දැනුවත් කර, අදාළ තොරතුරු කඩිනමින් යාවත්කාලීන කරන ලෙසයි.



තවද, කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් ක්‍රියාවට නංවන වැඩසටහන් සහ එහි ප්‍රගතිය පිළිබඳව නිරතුරුව ජනමාධ්‍ය ආයතන දැනුවත් කරන ලෙස ද, කාරක සභා සාමාජිකයන් විසින් පැමිණි සිටි නිලධාරීන් වෙත උපදෙස් ලබා දෙන ලදී.



# රුපියල් මිලියන 3100 ක් වැය කොට මිලදී ගත් විදුලි ජනක යන්ත්‍ර 50 ක් මිලදී ගන්නා විට ක්‍රියාකාරී තත්ත්වයේ නොපැවතීම පිළිබඳ කෝප් කමිටුවේ අවධානය

*2018, 2019 කාලසීමාවට අදාළව රුපියල් මිලියන 3100ක් වැය කොට මිලදීගත් විදුලි ජනක යන්ත්‍ර 50ක් මිලදී ගන්නා විටම ක්‍රියාකාරී තත්ත්වයේ නොපැවතීම පිළිබඳව කෝප් කමිටුවේදී අවධානය යොමු විය.*

මේ පිළිබඳ අවධානය යොමු වුයේ ලංකා විදුලිබල මණ්ඩලයේ 2017 සහ 2018 වර්ෂයන්ට අදාළ විගණකාධිපති වාර්තා හා වර්තමාන කාර්යසාධනය පිළිබඳ පරීක්ෂා කිරීමට පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව එහි සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී (මහාචාර්ය) ගරු චරිත හේරත් මහතාගේ සභාපතිත්වයෙන් මේ මස පාර්ලිමේන්තුවේදී රැස් වූ අවස්ථාවේදීය.

මෙම ජනක යන්ත්‍ර 50 පිළිබඳ තොරතුරු සාකච්ඡා කිරීමේදී කමිටුවේ සාමාජික මන්ත්‍රීවරුන් ද මේ පිළිබඳ අදහස් දැක්වීම සිදු කළ අතර ඔවුන් පෙන්වා දුන්නේ මෙම ජනක යන්ත්‍ර මිලදී ගන්නා විට ක්‍රියාකාරී තත්ත්වයේ නොපැවතී ඇති බවයි. මේ නිසා මෙම මිලදී ගැනීම් වලදී තත්ත්ව පරීක්ෂාවක් සිදු වුවාද යන්න සහ මේ සඳහා වියදම් වූ මිල පිළිබඳව ඔවුන් විසින් විමසන ලදී.

මෙහිදී පැමිණ සිටි නිලධාරීන් පෙන්වා දුන්නේ මෙම මිලදීගැනීම්වලදී නිලධාරීන් පරීක්ෂාවක් සිදු කොට ඇති බවත් එම මිලදී ගැනීම සඳහා රුපියල් මිලියන 3100ක් වැයවූ බවත් අද වන විට මෙම ජනක යන්ත්‍ර

50ම ක්‍රියාකාරීව පවතින බවත්ය. මෙහිදී තවදුරටත් අදහස් දැක්වූ කාරක සභා සාමාජික මන්ත්‍රීවරු සඳහන් කළේ මෙම ජනක යන්ත්‍ර මුල්කාලීනව ක්‍රියාත්මක නොවූ බවත් නවීකරණය කිරීමෙන් පසු ක්‍රියාත්මක වන බවත්ය. ඒ අනුව කුමණ ආණ්ඩු කාලසීමාවක මිලදී ගත්තද ක්‍රියාකාරී තත්ත්වයේ නොපවතින ජනක යන්ත්‍ර මිලදී ගැනීම පිළිබඳ විධිමත් පරීක්ෂණයක් සිදු කළ යුතු බවයි.




මෙහිදී කෝප් කමිටු සභාපතිවරයා මේ පිළිබඳ වාර්තාවක් සති 2ක් ඇතුළත විගණකාධිපති දෙපාර්තමේන්තුවට ලබා දෙන ලෙස නිර්දේශ කළේය.

එසේම ඇඹිලිපිටිය එස් පවර් බලාගාරයෙන් විදුලිය මිලදී ගැනීම පිළිබඳවද මෙහිදී සාකච්ඡා විය. මෙම බලාගාරයෙන් විදුලිය මිලදී ගැනීමේදී නව ගිවිසුම් වලට එළඹීම පිළිබඳව කෝප් කමිටු සභාපතිවරයා ප්‍රශ්න කළේය. පැමිණ සිටි සාමාජික මන්ත්‍රීවරු විසින්ද විදුලිය මිලදීගැනීමට නව ගිවිසුමක් සකස් කිරීමේදී මිල ගණන් තීරණය කිරීම සිදු වන ආකාරය පිළිබඳව විමසන ලදි. මේ සඳහා නිශ්චිත පිළිතුරක් ලංකා විදුලිබල මණ්ඩලයේ නිලධාරීන්ගෙන් නොලැබුණ අතර මාසයක් ඇතුළත මේ පිළිබඳ වාර්තාවක් ලබාදෙන ලෙස කෝප් කමිටු සභාපතිවරයා නිර්දේශ කළේය.

එසේම දිගුකාලීන ජනන සැලැස්ම පිළිබඳවද සාකච්ඡා වූ අතර මෙහිදී සඳහන් වූයේ 2022 - 2041 වර්ෂය සඳහා සකසා ඇති නව ජනන සැලැස්ම පිළිබඳ තොරතුරු විගණකාධිපති දෙපාර්තමේන්තුවට ලැබී නැති බවයි. විගණකාධිපති දෙපාර්තමේන්තුව සතුව පවතින්නේ 2018 - 2037 වර්ෂ සඳහා සකස් කළ ජනන සැලැස්මට අදාළ තොරතුරු බව මෙහිදී සඳහන් විය. මේ අනුව කෝප් කමිටු සභාපතිවරයා නිර්දේශ කළේ හැකි ඉක්මනින් අනුමතිය ලැබී ඇති නව ජනන සැලැස්ම විගණකාධිපති දෙපාර්තමේන්තුවට ලබාදීමට කටයුතු කරන ලෙසයි. මෙහිදී පැමිණ සිටි නිලධාරීන් පෙන්වා දුන්නේ 2019ට පෙර පැවති ආණ්ඩුවේ ප්‍රතිපත්ති අනුව පුනර්ජනනීය බලශක්තිය 50% සපුරාලීමේ අවශ්‍යතාව පෙන්වා දුන්නද නව රජය බලයට පත්වීමත් සමඟ පුනර්ජනනීය බලශක්ති අවශ්‍යතාව 70% ක් ලෙස පෙන්වා දුන් බවයි. ඒ අනුව නව ජනන සැලැස්ම සකස් කළ බව ඔවුහු පෙන්වා දුන්හ.

මෙහිදී කෝප් කමිටු සභාපතිවරයා පෙන්වා දුන්නේ දේශපාලන අධිකාරිය වෙනස්වීම මත ප්‍රතිපත්ති වෙනස් වුවද ජනන සැලැස්ම වෙනස් නොවී පවත්වාගෙන යාම වැදගත් වන බවයි.

මීට අමතරව ඉන්දියාවේ "අදානි" සමාගම සමඟ එළඹී ඇති අවබෝධතා ගිවිසුම පිළිබඳව ද ඒ සඳහා සිදුකරන ශක්‍යතා අධ්‍යනය පිළිබඳව ද, හදිසි බලශක්ති මිලදීගැනීම් පිළිබඳව ද, පාරිභෝගිකයින්ගෙන් ලබාගන්නා තැන්පතු සඳහා පොලිය පිළිබඳව ද මෙහිදී සාකච්ඡා විය.



# මැතිවරණ සහ ඡන්ද විමසීම් ව්‍යුහයේ හා නීති රීතිවල ප්‍රතිසංස්කරණ හඳුනාගැනීමටත්, ඒ සම්බන්ධයෙන් අවශ්‍ය සංශෝධන ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේ අවසන් වාර්තාව පාර්ලිමේන්තුවට



**මැතිවරණ සහ ඡන්ද විමසීම් ව්‍යුහයේ හා නීති රීතිවල ප්‍රතිසංස්කරණ හඳුනාගැනීමටත්, ඒ සම්බන්ධයෙන් අවශ්‍ය සංශෝධන ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේ අවසන් වාර්තාව එම කාරක සභාවේ සභාපති සභානායක, අමාත්‍ය ගරු දිනේෂ් ගුණවර්ධන මහතා විසින් මේ මස පාර්ලිමේන්තුවට සභාගතකරන ලදී.**

2021 මැයි මස 17 වන දින පළමුවරට රැස් වූ මෙම කාරක සභාව තම අදහස් ප්‍රකාශ කිරීම සඳහා ජනතාවට ඇති අයිතියට ගරු කරමින් මැතිවරණ ප්‍රතිසංස්කරණ පිළිබඳ මහජනතාව සහ උනන්දුවක් දක්වන සංවිධාන වෙතින් නියෝජනයන් ඉදිරිපත්කරන ලෙස දක්වමින් පළ කරන ලද පුවත්පත් නිවේදනයට ප්‍රතිචාර ලෙස රාජ්‍ය නොවන සංවිධාන, ආගමික සංවිධාන, කාන්තා කණ්ඩායම්, විවිධ සංස්කෘතික හා ජන වාර්ගික කණ්ඩායම්වල නියෝජනයන් සහ සාමාන්‍ය මහජනතාව ඇතුළු පාර්ශවකරුවන් විසින් ඉදිරිපත් කරන ලද නියෝජනයන් 160ක් පමණ කාරක සභාව වෙත ලැබී තිබුණි. ඊට අමතරව පිළිගත් දේශපාලන පක්ෂ 69කින් තම නියෝජනයන් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා තිබූ අතර ඒ අනුව පිළිගත් දේශපාලන පක්ෂ 36ක් කාරක සභාව වෙත තම ලිඛිත සහ වාචික නියෝජනයන් ඉදිරිපත් කර තිබුණි. මේ සඳහා පාර්ලිමේන්තුව නියෝජනය කරන දේශපාලන පක්ෂද ඇතුළත් විය.

පසුව කාරක සභා රැස්වීම් වාර 29ක් තුළදී පිළිගත් දේශපාලන පක්ෂ, සාමාන්‍ය ජනතාව සහ උනන්දුවක් දක්වන සංවිධාන, කාන්තාවන් නියෝජනය කරන සංවිධාන සහ විද්‍යුත් මාධ්‍ය ආයතන මඟින් ඉදිරිපත් කළ වාචික සහ ලිඛිත නියෝජනයන් සියල්ලම කාරකසභාව විසින් සලකා බලමින් කාරක සභාවේ අවසන් වාර්තාව මෙසේ සභාගත කර තිබේ.

මෙම වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගතකරමින් එම කාරක සභාවේ සභාපති සභානායක, අමාත්‍ය ගරු දිනේෂ් ගුණවර්ධන මහතා එහි සඳහන් නිරීක්ෂණ මෙන්ම නිර්දේශ පිළිබඳව ද පැහැදිලි කරන ලදී.



■ බොහෝ දූෂණයන්ගෙන් පිරුණු වියදම් අධික ඡන්ද ක්‍රමයක් බවට මැතිවරණ පත්ව ඇත්තේ සහ මැතිවරණ නීති උල්ලංගනය වීම සිදුවන්නේ අසීමිත ලෙස අද මැතිවරණ තුළ වියදම් සිදුකිරීමට පරිවර්තනය වී තිබීම නිසා බව ද එබැවින් මැතිවරණ වියදම් පාලනය කිරීමේ නීති සම්පාදනය, චර්යාධර්ම පද්ධතියක් අනුගමනය කිරීම සහ මැතිවරණයේදී රාජ්‍ය සම්පත් අවභාවිතය වැලැක්වීම පිළිබඳව ද

යෝජනා මෙම වාර්තාවේ අන්තර්ගත වන බව හෙතෙම පෙන්වා දුන්නේය.

ඒ අනුව ඉදිරිපත් කළ මෙම අවසාන වාර්තාව තුළ නිරීක්ෂණ 25 ක් අන්තර්ගත වේ. එසේම මෙම වාර්තාව තුළ නිර්දේශ 15 ක් ද අන්තර්ගත වේ.

මෙහිදී මැතිවරණ ක්‍රම පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර ඇති අතර ඒ යටතේ පළාත් පාලන මැතිවරණ, පළාත් සභා මැතිවරණ සහ පාර්ලිමේන්තු මැතිවරණය පිළිබඳව නිර්දේශ ද, කාන්තා නියෝජනය වැඩිකිරීම පිළිබඳව නිර්දේශ ද, යොවුන් නියෝජනය යටතේ පළාත් පාලන මැතිවරණ සහ පළාත් සභා මැතිවරණ වල නාම යෝජනා ලැයිස්තු තුළ යොවුන් නියෝජනය සඳහා 25% ක පංගුවක් (කෝටාවක්) වෙන් කිරීම අනිවාර්ය කිරීම උදෙසා නෛතික විධිවිධාන හඳුන්වාදීම පිළිබඳ නිර්දේශ ද ඇතුළත් වේ.

එසේම ඡන්ද දායකයන්ගේ පිළිගැනීම මත දේශපාලන පක්ෂ පිළිගැනීම සම්බන්ධව නිර්දේශ ද, මාධ්‍ය යන කොටස යටතේ මාධ්‍ය උපමාන, විද්‍යුත් මාධ්‍ය තුළින් දේශපාලන ප්‍රචාරණ කටයුතු සිදු කිරීම, මැතිවරණ නීති උල්ලංඝනය කරමින් සමාජ මාධ්‍ය වේදිකාවන් විසින් සිදු කරනු ලබන මැතිවරණ ප්‍රචාරණ කටයුතු, තොරතුරු වැරදි ලෙස අර්ථ නිරූපණය කිරීම සහ ව්‍යාජ තොරතුරු ප්‍රචාරය කිරීම පිළිබඳ නිර්දේශ ද මීට ඇතුළත් වේ.

තවද මැතිවරණ ප්‍රචාරණ කටයුතු, ඡන්දය ප්‍රකාශකිරීමේ අයිතිය, නාමයෝජනා ක්‍රමවේදය, මැතිවරණ ක්‍රියාදාමය, මැතිවරණ විනිශ්චය සභාව, මැතිවරණය අවසන් වනතුරු පළාත් පාලන ආයතනවල හා පළාත් සභාවල බලතල කොමසාරිස්වරයා /ලේකම්වරයා හා පළාත් ලේකම්වරයා වෙත අභිනියෝජනය කළ යුතු බව, පළාත් පාලන ආයතනයක් මඟින් වාර්ෂික අයවැය අනුමත කිරීමට අසමත් වීම, පළාත් පාලන මැතිවරණවලට තරඟ කිරීමට ක්ෂේත්‍ර නිලධාරීන්ට ඇති සීමාව, ජාතික ලැයිස්තුව සහ සීමා නිර්ණය යන අංශ පිළිබඳව ද මෙම අවසන් වාර්තාවේ නිර්දේශ ඇතුළත් වේ.

මේ අනුව,

- පළාත් සභා මැතිවරණය පිළිබඳ අදහස් ප්‍රකාශ කරමින් පවතින නීති සංශෝධනය හෝ නව නීති රීති සකස් කිරීමට ද එසේ නොමැති නම් පැරණි ඡන්ද ක්‍රමය යටතේ එය පැවැත්වීමටද

- විවිධ පාර්ශ්ව විසින් මිශ්‍ර ඡන්ද ක්‍රමයක අවශ්‍යතාව යෝජනා කර ඇති අතර මෙම වාර්තාව මඟින්ද මිශ්‍ර ඡන්ද ක්‍රමයක අවශ්‍යතාව පෙන්වා දීම ද

- පළාත් පාලන මැතිවරණයේ එල්ලන ලද ආසන ඉවත් කිරීම ද

- කාන්තා නියෝජනයට අතිරේකව තරුණ නියෝජනය සහතික කිරීම ද


- ජනමාධ්‍ය මැතිවරණ සමයේ අනුගමනය කළ යුතු යුතුකම් හා වගකීම්, බැඳීම් පිළිබඳ මැතිවරණ කොමිෂන් සභාව විසින් කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලද කරුණු සැලකිල්ලට ගෙන ක්‍රියාත්මක විය යුතු බව ද

- දේශපාලන පක්ෂ ලියාපදිංචිය පිළිබඳව සඳහන් කරමින් 70 කට අධික දේශපාලන පක්ෂ ලියාපදිංචිය ලබා තිබුණද ක්‍රියාකාරීත්වය පිළිබඳ විවිධ කරුණු මතුවී තිබෙන බැවින් පාර්ලිමේන්තු මැතිවරණය හා අනෙකුත් මැතිවරණවලට ඉදිරිපත්වීම සඳහා ප්‍රාදේශීය සහ අනෙකුත් වශයෙන් පිළිගන්නා දේශපාලන පක්ෂ වෙන්කිරීම පිළිබඳව ද

- විද්‍යුත් මාධ්‍ය තුළින් දේශපාලන ප්‍රචාරණ සිදු කිරීමේදී බොහෝ අපේක්ෂකයන්ට වන අඩුපාඩු සම්බන්ධයෙන් සාධාරණත්වයෙන් කටයුතු කළ යුතු බවට ද

# ආණ්ඩුවේ බදු ප්‍රතිපත්ති වෙනස් වීමට වඩා වාහන ආනයනය නැවතීම ඇතුළු කොවිඩ් තත්ත්වය රටේ ආර්ථික බිඳවැටීමට හේතු වුණා

## *මුදල් අමාත්‍යාංශයේ හිටපු ලේකම් එස්. ආර්.ආටිගල*



2019 වසර අවසානයේ නව ආණ්ඩුවේ බදු ප්‍රතිපත්ති වෙනස් වීම හේතුවෙන් රුපියල් බිලියන 500කට ආසන්න මුදල් ප්‍රමාණයක් රටට අහිමි වූ බව ප්‍රකාශ කිරීම සාධාරණ නොවන බවත් ඒ සඳහා වාහන ආනයනය නතර කිරීම ඇතුළුව පනවනු ලැබූ ආනයන සීමා හේතුවෙන් ඇති වූ පාඩුව සහ කොවිඩ් තත්ත්වය හේතුවෙන් ඇති වූ ආර්ථික සංකෝචනය ඇතුලු හේතූන් බලපෑ බව මුදල් අමාත්‍යාංශයේ හිටපු ලේකම් එස්. ආර්. ආටිගල මහතා පැවසිය.

ඒ මහතා මේ බව ප්‍රකාශ කර සිටියේ පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතාගේ සභාපතිත්වයෙන් මේ මස පාර්ලිමේන්තුවේදී පැවති රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේදීය.

2019 වර්ෂයේ දෙසැම්බර් 04 වන දින හිටපු අග්‍රාමාත්‍ය ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලැබූ පළමු කැබිනට් පත්‍රිකාවට අනුව බදු ප්‍රතිපත්ති සම්බන්ධයෙන් මෙලෙස තීරණ ගනු ලැබූ බවද ආටිගල මහතා මෙහිදී වැඩිදුරටත් පැවසීය.

හිටපු ජනාධිපති ලේකම් ආචාර්ය පී.බී ජයසුන්දර, මහා භාණ්ඩාගාරයේ සහ මුදල් අමාත්‍යාංශයේ හිටපු ලේකම් එස්. ආර්. ආටිගල, හිටපු මහ බැංකු අධිපති අජිත් නිවාඩ් කබ්‍රාල් යන මහත්වරුද හිටපු මුදල් මණ්ඩල සාමාජිකයන්, වත්මන් මහ බැංකු අධිපති ආචාර්ය නන්දලාල් වීරසිංහ මහතා ඇතුළු මහ බැංකුවේ ඉහළ නිලධාරීන් මෙම රජයේ මුදල් පිළිබඳ කාරක සභා රැස්වීමට සහභාගීව සිටියහ.

කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමේදී ඒ අදාළ විෂය සම්බන්ධයෙන් ඊට සමගාමීව පසුබිම් සටහනක් සහ වාර්තාවක් තිබිය යුතු බවත් එහි සම්පූර්ණ වගකීම ඇත්තේ එම විෂය සම්බන්ධ නිලධාරීන්ට බවත් මුදල් කාරක සභා සමාජිකයන්ගේ අදහස වූ අතර යම් යම් නොවැලක්විය හැකි තත්ත්වයන් තිබුණු බව පිළිගත හැකි වුවද මහ බැංකුවේ සහ මුදල් අමාත්‍යාංශයේ නිසි අධ්‍යයනයකින් පසුව මෙවන් තීරණ ගත යුතුව තිබූ බවද ඔවුහු පැවසූහ.

මෙහිදී රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ කමිටු සමාජිකයින් තවදුරටත් විමසා සිටියේ කොවිඩ් තත්ත්වය මතු වීමට ප්‍රථම, එවකට දේශපාලන බල





අධිකාරිය විසින් ගනු ලැබූ මූල්‍යමය ප්‍රතිපත්ති තීරණ සම්බන්ධයෙන් ඉදිරියේදී මතු විය හැකි ගැටලුකාරී තත්ත්වයන් පිළිබඳ මුදල් මණ්ඩලයේ පැහැදිලි නිගමන ඇතුළත් වාර්තාවක් ආර්ථික විශේෂඥයන් සහ වෘත්තිකයන් වශයෙන් කිසිවෙකු හෝ ලිඛිතව දැනුම් දීමට කටයුතු කරනු ලැබුවේද යන්නයි.

මෙහිදී අදහස් දැක්වූ හිටපු ජනාධිපති ලේකම් ආචාර්ය පී. බී. ජයසුන්දර මහතා පවසා සිටියේ මෙවන් තීරණ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබන බවත්, ඉන්පසුව එය කාරක සභා වෙතද යොමු කරනු ලබන බවත්ය.

මෙහිදී රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සමාජිකයන් නැවතත් විමසා සිටියේ, ආර්ථික විශේෂඥයන් සහ වෘත්තිකයන් වශයෙන් දේශපාලන අධිකාරිය ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ නිවැරදි නොවන අවස්ථාකදී, එවකට රජයේ වගකිවයුතු තනතුරු දැරූ නිලධාරීන් ලෙස එය නිසි අයුරින් සිය ඉහළ බලධරයන්ට පෙන්වා දීමට හා දැනුවත් කිරීමට කටයුතු කරනු ලැබුවේද යන්නයි.

මෙහිදී අදහස් දැක්වූ වත්මන් මහ බැංකු අධිපති (ආචාර්ය) නන්දලාල් වීරසිංහ මහතා පවසා සිටියේ රජයේ වගකිව යුතු නිලධාරීන් දේශපාලනය කිරීමෙන් වැළකිය යුතු බවත් දේශපාලඥයකු සහ නිලධාරියකු අතර තිබෙන වෙනස නිසි ලෙස හඳුනාගත යුතු බවත්ය. තවදුරටත් අදහස් දක්වමින් ඒ මහතා පවසා සිටියේ දේශපාලඥයන් විසින් ගනු ලබන තීරණ නිවැරදි නොවන අවස්ථාවන්හිදී එය පැවසීම නිලධාරීන්ගේ වගකීම සහ යුතුකම වන බවත්, එවන් තීරණවලට ලැබෙන ප්‍රතිඵල සඳහා දේශපාලඥයන් පමණක් වග නොකිය යුතු බවත්ය. වසර දෙකක් යන තුරු රටේ ආර්ථිකය නිසි මාර්ගයේ ගමන් නොකළ බව මෙන්ම රටේ ආර්ථිකය බිඳ වැටෙනතුරුම තමන් දැනුවත් නොවූ බවත් දේශපාලන අධිකාරියේ තීරණ මත පමණක් පදනම්ව එම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කළා යැයි පැවසීම අනුමත කළ නොහැකි බවත් මෙහිදී වීරසිංහ මහතා වැඩිදුරටත් පෙන්වා දුන්නේය.

මෙම කාරකසභාවට සහභාගී වූ මන්ත්‍රීවරුන් පැවසුයේ තමන් මෙම ප්‍රතිපත්ති සම්බන්ධයෙන් ඇතිවිය හැකි අතුරු ප්‍රතිඵල පිළිබඳ විවිධ අවස්ථාවන්වලදී වගකිව යුතු නිලධාරීන්ට සහ එවකට දේශපාලන බලාධිකාරියට පැවසුවද කිසිවෙක් ඒ පිළිබඳ අවධානය යොමු නොකළ බවයි.

එහිදී කාරක සභා සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු අනුර ප්‍රියදර්ශන මහතා පවසා සිටියේ උපයන විට ගෙවීමේ බදු ක්‍රමය කිසිඳු හේතුවක් නොමැතිව ඉවත් කිරීම මගින් විශාල ගැටළු රාශියක් ඇති වූ බවත් (PAYE Tax) මෙලෙස බදු කපා හැරීම් හේතුවෙන් 12.5ව තිබූ රාජ්‍ය ආදායම 8.7 අඩු වූ බවත් ය.

එසේම මහ බැංකුවේ නිලධාරීන් සහ පාර්ලිමේන්තුව අතර සම්බන්ධතාවය වැඩි කර ගනිමින් නිසි සන්නිවේදනයක් සහිතව රටේ වැදගත් තීරණ ගැනීමේදී කටයුතු කළ යුතු බවද කාරක සභා සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා අවධාරණය කළේය.



# හම්බන්තොට වරාය 99 වසරකට බදුදීමෙන් ගත් මුදලින් වරාය ඉදිකිරීමට ගත් ණය ගෙවා නැහැ

## -කෝප් කමිටුවේදී අනාවරණය වෙයි -



හම්බන්තොට වරාය 2017 වසරේදී බදුදීමෙන් ලද මුදලින් වරාය ඉදිකිරීමට ගත් ණය ගෙවා නැති බවත් එම මුදල් වෙනත් කාර්යන් සඳහා යොදවා ඇති බවත් මේ මස පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී (කෝප් කමිටුව) අනාවරණය විය.

මේ අනුව 2017 වසරේ වරාය 99 වසරක බද්දට දීමේදී ලැබුණු මුදල මෙන්ම ඉතිරි ණය මුදල වරාය අධිකාරිය විසින් මහාභාණ්ඩාගාරයට ලබා දුන් බවත් ණය පොලී අනුපාතය අඩු අගයක් ගත් බැවින් වරාය ඉදිකිරීමට ගත් ණය මුදල පියවීම සිදුනොකොට භාණ්ඩාගාරය විසින් රජයේ වියදම් සඳහා යොදා ගෙන ඇති බවත් මෙහිදී හෙළිවිය.

මහා භාණ්ඩාගාරය විසින් මේ වන විට ණය හා පොලිය ආපසු ගෙවීම සිදු කළ ද ගිණුම් ප්‍රකාශනවල නිසි පරිදි එය ණය ගෙවීමක් බව සටහන් නොවන බවද මෙහිදී අනාවරණය විය.

2017 නොවැම්බර් 30 වන විට වරාය අධිකාරියේ ගිණුම්වල ඉතිරිව පැවති රු. මිලියන 147,746 ක ණය හා පොලී ශේෂය සහ රු.මිලියන 31,545 ක විදේශ විනිමය පරිවර්තන අලාභය වරාය අධිකාරිය විසින් මහාභාණ්ඩාගාරයේ හෝ කැබිනට් අනුමතියකින් තොරව මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත්ව කර ඇති බව අනාවරණය විය.

මේ අනුව හම්බන්තොට වරාය ඉදිකිරීම සඳහා ලබා ගෙන තිබූ විදේශ ණය ප්‍රමාණය රජයේ කිසිඳු ගිණුම් ප්‍රකාශනයක මේ වන විට නොපෙන්වන බවද මෙහිදී කෝප් කමිටුව හමුවේ වැඩිදුරටත් අනාවරණය විය.

- **වරාය ඉදිකිරීම සදහා ලබා ගෙන තිබූ විදේශ ණය ප්‍රමාණය රජයේ කිසිඳු ගිණුම් ප්‍රකාශනයක මේ වන විට නොපෙන්වන බවද හෙළි වෙයි**
- **වරාය අධිකාරියේ අවිධිමත් හා සංකීර්ණ සේවක බඳවා ගැනීම් නවතා නෛතික රාමුව තුළ පමණක් කටයුතු කිරීමට නිර්දේශ**
- **වරාය අධිකාරියේ සේවකයන් සදහා ගෙවා ඇති රු. මිලියන 5,850ක අතිවිශාල අතිකාල දීමනා වෙනුවට සාධාරණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමටත් නිර්දේශ**

මේ අනුව මේ පිළිබඳ මුදල් අමාත්‍යාංශය, වරාය අධිකාරිය සමඟ සාකච්ඡා කොට නිසි පරිදි මෙය ගිණුම් ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට අවශ්‍ය පියවර ගෙන මසක් ඇතුළත කෝප් කමිටුවට වාර්තා කරන ලෙස වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශ ලේකම්වරයාට කෝප් සභාපතිවරයා නිර්දේශ කළේය.

2017 නොවැම්බර් සිට මෙහෙයුම් කටයුතු නතර කර තිබූ අධිකාරියේ පරිපාලිත සමාගමක් වන මාගම්පුර වරාය කළමණාකරණ සේවා පුද්ගලික සමාගම විසින් 2014 වර්ෂයේදී නැව් තෙල් මිලදී ගැනීම සඳහා මෙරට බැංකුවකින් ඇ.ඩො මිලියන 24ක ණය මුදලක් ලබා ගෙන ඇති බවත් එම මුදල පියවීමට අපොහොසත්වීම නිසා අදාළ බැංකුව මෙම සමාගමට විරුද්ධව නඩු පවරා ඇති බවත් මෙහිදී හෙළි විය.

මෙහිදී අනාවරණය වූයේ ඇ.ඩො මිලියන 24ක නැව් තෙල් මිලදී ගත්තද එම තෙල් භාවිත නොකොට දීර්ඝ කාලයක් ගබඩා කර තැබීම නිසා කල් ඉකුත් වූ පසු ඇ.ඩො.මිලියන 3.5 කට විකුණා ඇති බවයි. මේ අනුව ඇ.ඩො මිලියන 20.5 කට ආසන්න අලාභයක් මෙහිදී සිදුවී ඇති බවට නිරීක්ෂණය විය. චීන සමාග මකට 2017 දී වරාය බදු දීමේදී මෙම 'මාගම්පුර වරාය කළමණාකරණ සේවා පුද්ගලික සමාගමේ' තෙල් ටැංකි සියල්ලම ද පවරා දීම සිදු කර ඇති බවත් එම අවස්ථාවේදී මෙම ණය මුදල් පිළිබඳව අනාවරණය කර නොමැති බවත් මෙහිදී වැඩිදුරටත් අනාවරණය විය. එම හිටපු අධ්‍යක්ෂ මණ්ඩලය සහ උපදේශකවරුන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට වහාම මැදිහත් වන ලෙස මෙහිදී අමාත්‍යාංශ ලේකම්වරයාට කමිටුව නිර්දේශ කළේය.

වරාය අධිකාරියේ අනුමත සේවක සංඛ්‍යාව වන 9990 ඉක්මවා නොගියද අවිධිමත් හා සංකීර්ණ ලෙස බඳවා ගැනීම් සිදුව ඇති බව මෙහිදී හෙළිවිය. වරාය අධිකාරිය 2010 වසරේදී ඉදිරිපත්කොට ඇති සේවකයන් බඳවා ගැනීමේ පටිපාටිය (SOR) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත වී නොමැති බවද මෙහිදී අනාවරණය විය. ආයතනය සහ සේවකයන් අතර සාමුහික ගිවිසුම් මඟින් බඳවා ගැනීමේ පටිපාටිය හා වැටුප් තල තීරණය කොට ඇති බවත් මෙහිදී වරාය අධිකාරියේ නිලධාරීහු පැවසූහ.




කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ සහ වැටුප් කොමිසමේ නිර්දේශයන්ට වරාය අධිකාරය එකඟත්වය පළ කර නොමැති බවද ඒ අනුව තනතුරු පමණක් අනුමත කර ඇති බව ද මෙහිදී හෙළි විය. අධිකාරියේ අදාළ වැටුප් තල අනුමත නොවන නිසා බඳවා ගැනීමේ පටිපාටියද (SOR) අනුමත කරගත නොහැකි වී ඇති බවද තවදුටරටත් මෙහිදී අනාවරණය විය.

සාමුහික ගිවිසුම් මඟින් වැටුප් තල හා බඳවා ගැනීමේ පටිපාටිය තීරණය කළද වරාය අධිකාරිය යනු මෙරට තුළ පිහිටා ඇති ආයතනයක් බැවින් අනෙකුත් ආයතනවලට අදාළ නෛතික රාමුව තුළ පමණක් සිදු වීමේ අවශ්‍යතාව මෙහිදී කෝප් සභාපතිවරයා අවධාරණය කළේය. යම් විශේෂිත හේතු කාරණා ඇත්නම් ඒ පිළිබඳ සාකච්ඡා කොට නෛතික රාමුව ඔස්සේ මෙම ගැටලුව කඩිනමින් විසඳා ගැනීමට කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව ඇතුළු අදාළ ආයතන සමඟ කඩිනමින් සාකච්ඡා කොට මේ පිළිබඳ නිසි තීරණයක් වහාම ගන්නා ලෙස කෝප් සභාපතිවරයා අමාත්‍යාංශ ලේකම්වරයාට නිර්දේශ කළේය.



# ගිවිසුම් හා බැඳුම්කර කඩ කළ මොරටුව විශ්ව විද්‍යාලයේ අචාර්යවරුන්ගෙන් අයවිය යුතු මුදල රුපියල් 51,649,961ක්

## කෝප් කමිටුවේදී අනාවරණය වෙයි

**මොරටුව විශ්ව විද්‍යාලයේ පමණක් අධ්‍යයන නිවාඩු ලබා විදේශගත වූ විශ්ව විද්‍යාල අචාර්යවරුන් 35 දෙනෙක් ගිවිසුම් හා බැඳුම්කර කඩ කිරීම නිසා 2021 දෙසැම්බර් 31 දින වනවිට අය විය යුතු මුදල රුපියල් 51,649,961 බවට කෝප් කමිටුවේදී අනාවරණය විය. ගිවිසුම් හා බැඳුම්කර කඩ කොට වසර 08ක් තිස්සේ නොගෙවූ අචාර්යවරු 16 දෙනෙකුගෙන් අයවිය යුතු මුදල රුපියල් 23,190,595ක් බවද එහිදී හෙළිදරව් විය.**



මෙහිදි නිලධාරීන් සඳහන් කළේ ගිවිසුම් හා බැඳුම්කර කඩ කළ ආචාර්යවරුන්ගෙන් බැඳුම්කර වටිනාකම් අය කර ගැනීම පිළිබඳ සඳහන් කළ උපකුලපතිවරයා පැවසුවේ ඉහත සංඛ්‍යාවෙන් 05ක් දැනට අය කරගෙන ඇති බවත්, 12ක් වාරික වශයෙන් අයකර ගැනිමට කටයුතු කරන අතර 11ක් වෙනුවෙන් නීතිමය පියවර ගෙන ඇති බවයි.

මෙම කරුණු අනාවරණය වූයේ කෝප් කමිටුව එහි සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී (මහාචාර්ය) ගරු චරිත හේරත් මහතාගේ ප්‍රධානත්වයෙන් මේ මස 08 වැනිදා පාර්ලිමේන්තුවේදී රැස්වූ අවස්ථාවේදිය. මොරටුව විශ්ව විද්‍යාලයේ 2019 සහ 2020 වර්ෂවලට අයත් විගණකාධිපති වාර්තා සහ වත්මන් කාර්ය සාදනය විමර්ශනය කිරිම සඳහා කෝප් කමිටුව හමුවට කැඳවා තිබිණි.

මොරටුව විශ්ව විද්‍යාලය මූලික වශයෙන් ගණිත, විද්‍යා, ඉංජිනේරු සහ තාක්ෂණ විෂයන් මූලික කරගත් උපාධි පාඨමාලා පමණක් පවත්වන බව උපකුපතිවරයා දැනුම්දුන්නේ කොප් සභාපතිවරයා කරන ලද විමසීමකට පිළිතුරු ලබාදෙමිනි.



මොරටුව විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පිඨයේ මේ වන විට අධ්‍යයන වර්ෂ දෙකක සිසුන් අධ්‍යාපනය ලබන බවත් ඊලඟ අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමට නියමිත නමුත් පීඨය සඳහා කිසිඳු ගොඩනැගිල්ලක් මේ වන තෙක් ඉදි කොට නොමැති බවත් උපකුලපතිවරයා සඳහන් කළේය. වෛද්‍ය පීඨයේ තුන්වන සහ අවසාන අධ්‍යයන වර්ෂ සඳහා නියමිත අධ්‍යයන කාර්ය මණ්ඩලය නියමිත පරිදි ලබාදෙන ලෙසද උපකුලපතිවරයා මෙහිදී ඉල්ලා සිටියේය.

පීඨයේ මහාචාර්ය ඒකකය නාගොඩ රෝහල ආශ්‍රිතව පිහිටුවීමට තීරණය කොට ඇති නමුත් එහි අවශ්‍ය ගොඩනැගිලි ඉදිකිරීම සඳහා දැනට තෝරාගෙන ඇති අක්කර 15ක කළුතර නාගොඩ ඉඩම අත්පත් කර ගැනීම පිණිස ප්‍රතිපාදන ලැබී නොමැති බවද හෙතෙම සඳහන් කළේය. ඒ සඳහා බැංකු ණයක් ලබා ගැනීමට රජය විසින් උපදෙස් ලබා දී ඇති නිසා ඒ අනුව කටයුතු කරමින් පවතින බවද මහාචාර්යවරයා පැවසීය.

මෙහිදී කෝප් සභාපතිවරයා අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයාට සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට දැනුම් දුන්නේ මේ පිළිබඳ සොයා බලා කඩිනම් ක්‍රියාමාර්ග ගන්නා ලෙසයි.

ඒ ඒ කාලවලදී කටයුතු කරන දේශපාලන අධිකාරීන් විසින් තම අභිමතය මත විශ්ව විද්‍යාල සඳහා අනධ්‍යයන කාර්යමණ්ඩලවලට සේවකයන් පත් කිරීම විශාල ගැටලුවක් වී ඇති බවද කෝප් සභාපතිවරයා සඳහන් කළේය.

විශ්ව විද්‍යාලය තුළ පවත්වාගෙන යනු ලබන යුනි කන්සල්ටන්සි නැමැති සමාගමට තවමත් අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබා ගැනීමට අසමත් වීම සම්බන්ධව මෙහිදී කෝප් කමිටුව විමසා සිටි අතර

උපකුලපතිවරයා සඳහන් කළේ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ උපදෙස් පරිදි ඒ සඳහා අවශ්‍ය ලියකියවිලි විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යවා ඇති බවයි. මෙම ක්‍රියාවලිය ප්‍රමාද වීම සම්බන්ධව සිය නොසතුට පල කළ සභාපතිවරයා එම කටයුතු කඩිනම් කරන ලෙස දැනුම් දුනනේය.

එයට අමතරව මොරටුව විශ්ව විද්‍යාලය යටතේ ආරම්භ කරන ලද එල් කේ ඩොමේන් රෙජිස්ට්‍රි (Lk Domain Registry) සමාගම පිළිබඳවද සාකච්ඡා කෙරිනි. 2004.03.05 වැනි දින මොරටුව විශ්ව විද්‍යාලය සතු සමාගමක් ලෙස ලියාපදිංචි වී ඇති මෙම සමාග මේ අයිතිය මේ වන විට විශ්ව විද්‍යාලයට අහිමිවීම පිළිබඳව මෙහිදී දීර්ඝ වශයෙන් සාකච්ඡා කළ අතර කෝප් සභාපතිවරයා නිර්දේශ කළේ එල් කේ(.lk) ඩොමේන් රෙජිස්ට්‍රි සමාගම ජාතික වටිනාකමකින් යුත් ආයතනයක් ලෙස සලකා එහි අයිතිය නැවත මොරටුව විශ්ව විද්‍යාලයට ලබා ගැනීම කටයුතු කරන ලෙසයි.

විශ්ව විද්‍යාල ආශ්‍රිතව පවතින මෙවැනි සමාගම්වල නීතිමය රාමුව ශක්තිමත් කිරීමේ වැදගත්කමද සභාපතිවරයා මෙහිදී පෙන්වා දුන් අතර අමාත්‍යාංශ ලේකම්වරයා වෙත නිර්දේශ කළේ යුනි කන්සල්ටන්සි සමාගමට කැබිනට් අනුමතිය ලබා ගැනීම මෙන්ම එල් කේ ඩොමේන් රෙජිස්ට්‍රි, සහ ලර්න් (LEARN) නැමැති සමාගම් පිළිබඳ වාර්තාවක් මාස 03ක් ඇතුලත ලබා දෙන ලෙසයි. එමෙන්ම මුළු විශ්ව විද්‍යාල ක්ෂේත්‍රයම ආවරණය වන පරිදි විශ්ව විද්‍යාල ආශ්‍රිත උපදේශන සේවා සමාගම් වලට පොදු උපදෙස් මාලාවක් සැකසීමේ වැදගත්කමද සභාපතිවරයා පෙන්වා දුනනේය.

විශ්ව විද්‍යාලයේ ප්‍රසම්පාදන සැලැස්ම නියමිත පරිදි ඉදිරිපත් කිරීම, වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම, විගණන හා කළමණාකරන කමිටු රැස්වීම් පැවැත්වීම ආදී කරුණු සතුටුදායක මට්ටමක පවතින බවට මෙහිදී කෝප් සභාපතිවරයා විශ්ව විද්‍යාල පාලන අධිකාරිය අගැයීමට ලක් කළේය.




# රුපියල් බිලියන 695ක පරිපූරක ඇස්තමේන්තුවට රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ අනුමතිය

**අත්‍යාවශ්‍ය රාජ්‍ය සේවාවන් බාධාවකින් තොරව පවත්වා ගෙන යාමට අවශ්‍ය අරමුදල් සපයා ගැනීම සඳහා අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මහතා, මුදල් අමාත්‍යවරයා ලෙස මේ මස 07 වැනිදා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ රු. බිලියන 695ක පරිපූරක ඇස්තමේන්තුවට රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ අනුමතිය හිමිවිය.**

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතාගේ ප්‍රධානත්වයෙන් රැස්වූ රජයේ මුදල් කාරක සභාවේදී මෙම අනුමතිය හිමිවිය.

2022 වර්ෂයේදී ආර්ථිකයේ ඇති වූ අයහපත් තත්ත්වයන් හේතුවෙන් පීඩනයට පත් වූ සමාජයේ විවිධ කොටස් සඳහා සහන සැලසීමට සහ උද්ධමනය හේතුවෙන් සැපයුම්වල වියදම් ඉහළ යාම ආවරණය කිරීමට අවශ්‍ය අතිරේක ප්‍රතිපාදන සලසා ගැනීම සඳහා මෙම පරිපූරක ඇස්තමේන්තුව ඉදිරිපත් කොට තිබිණි.

පරිපූරක ඇස්තමේන්තුවට අදාළ රු. බිලියන 695ක මුදලින් රු. බිලියන 395ක් පුනරාවර්තන වියදම් වන



අතර රු. බිලියන 300ක් මූලධන වියදම් වේ. මෙහිදී අදහස් දක්වමින් මුදල් අමාත්‍යාංශ ලේකම් මහින්ද සිරිවර්ධන මහතා විසින් පරිපූරක ඇස්තමේන්තුව මගින් ප්‍රතිපාදන සපයා ගැනීමට අපේක්ෂා කරන අවශ්‍යතා කාරක සභාව හමුවේ පැහැදිළි කරන ලදී.

මේ අනුව 2022 ජනවාරි මාසයේ සිට රාජ්‍ය සේවකයන්ට ගෙවනු ලබන රුපියල් 5,000ක මාසික දීමනාව තවදුරටත් ගෙවීම වෙනුවෙන් රුපියල් මිලියන 87000ක මුදලක්ද 2022 ජනවාරි මාසයේ සිට විශ්‍රාමිකයන් සඳහා ගෙවනු ලබන රුපියල් 5000ක මාසික දීමනාව තවදුරටත් ගෙවීම වෙනුවෙන් රුපියල් මිලියන 40,000ක් ද 2022 ජනවාරි මාසයේ සිට සමෘද්ධිලාභීන්ට ගෙවනු ලබන රුපියල් 1000ක අමතර දීමනාව තවදුරටත් ගෙවීම වෙනුවෙන් රුපියල් මිලියන 15,000ක මුදලක්ද මෙම ඇස්මේන්තුව මගින් වෙන් කර ඇත.

තවද බලශක්ති අවශ්‍යතාවය සපුරා ගැනීම වෙනුවෙන් ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ගෙවීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය වෙත ප්‍රතිපාදන ලෙස රුපියල් මිලියන 50,000ක මුදලක්ද හරිත කෘෂිකර්මාන්තයේ යෙදවුම් භාවිතා කිරීම වෙනුවෙන් ඇගයීම් දිරිගැන්වීම් සඳහා රුපියල් මිලියන 12,000ක මුදලක්ද පොහොර සහනාධාරය සඳහා රුපියල් මිලියන 50,000ක මුදලක්ද පරිපූරක ඇස්තමේන්තුව මඟින් වෙන් කර ඇත.

මිල ගණන් ඉහළ යාම හේතුවෙන් ආරක්ෂක අංශ රෝහල් හා බන්ධනාගාරය වැනි ආයතන වල ආහාර හා අනෙකුත් සැපයීම් වල ඇති විය හැකි හිඟ ප්‍රතිපාදන සැලසීම සඳහා රුපියල් මිලියන 25,000ක්ද මිල ඉහළ යාම හේතුවෙන් ගෙවීමට සිදුවිය හැකි වෙනත් පුනරාවර්තන වියදම් සඳහා රුපියල් මිලියන 4,500ක්ද ණය පොලී ගෙවීම් සඳහා රුපියල් බිලියන 21,500 ක්ද මේ අතර වේ.

එසේම අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ආනයනය සඳහා ඉන්දියානු ණය වැඩසටහන යටතේ ලද ණය මුදල උපයෝජනය/ ගිණුම්ගත කිරීම සඳහා රුපියල් මිලියන 250,000ක්ද දුෂ්කර ආර්ථික තත්ත්වයන් හේතුවෙන් පීඩාවට පත් ජනතාව, සමෘද්ධි ප්‍රතිලාභීන් හා දැනට එවැනි යම් ප්‍රතිලාභයක් සඳහා සුදුසුකම් ලබා ඇති පොරොත්තු ලේඛනගතව සිටි ප්‍රතිලාභීන් සඳහා යෝජිත සහන උපයෝජනය සඳහා ලෝක බැංකුව සලසා දෙනු ලබන මිලියන 140,000 ක මුදලක් ද මෙම ඇස්තමේන්තුවට අයත් වේ.

මේ අනුව ලෝක බැංකුව හා ඉන්දියන් රජය විසින් සපයා දෙනු ලබන අරමුදල් හැර අනෙකුත් මුදල වන රුපියල් මිලියන 305,000ක් සඳහා දේශීය අරමුදල් සලසා ගත යුතුව පවතින බව මෙහිදී අනාවරණය විය.

රු. බිලියන 695ක මුදලක් ඇස්තමේන්තු ගත කළද අත්‍යවශ්‍ය වියදම් හැර අනෙකුත් සියලු වියදම් අවම කරමින් රු. බිලියන 300කට වැඩි මුදලක් ඉතිරි කර ගැනීමට අපේක්ෂා කරන බවද මුදල් අමාත්‍යාංශ ලේකම්වරයා මෙහිදී පැවසීය. ඒ අනුව ඉදිරියේදී මෙම සියලු කරුණු සලකා බලා සංශෝධිත අයවැයක් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන බවද සිරිවර්ධන මහතා කමිටුව හමුවේ පවසා සිටියේය.

තවද 2020 අංක 7 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ යෝජනා සම්මතයන් සඳහාද රජයේ මුදල් කාරක සභාවේ අනුමතිය හිමිවිය. 2020 අංක 7 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියට අනුව අදාළ වර්ෂයේදී උද්ගත වන අවශ්‍යතාවන් සලකා බලා විසර්ජන පනත යටතේ ලබා දී තිබූ අත්තිකාරම් ගිණුම් සීමාවන් සංශෝධනය කිරීමට මුදල් අමාත්‍යවරයා සතු බලතල අනුව මෙම නියමයන් පනවා ඇත.

# ශිෂ්‍ය පාර්ලිමේන්තු වැඩසටහන භාර සම්බන්ධීකරණ නිලධාරීන් දැනුවත් කෙරේ




**පාර්ලිමේන්තුවේ දැනුම ඔබ වෙතට ගෙන එන "පාර්ලිමේන්තු විදු පියස" වැඩසටහන් මාලාවේ දෙවැනි වැඩසටහන පසුගියදා ශිෂ්‍ය පාර්ලිමේන්තු වැඩසටහන භාර සම්බන්ධීකරණ නිලධාරීන් සඳහා පැවැත්විණි.**



පාර්ලිමේන්තු ක්‍රමවේදයන් පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට හුරු කරමින්, ප්‍රජාතන්ත්‍රවාදී සමාජ සන්දර්භයක සක්‍රිය පුරවැසි සහභාගීත්වය සහිතව ක්‍රියාත්මක වීම අවධාරණය කරමින් අනාගත දේශපාලන ක්‍රියාවලියට අවශ්‍ය මඟ පෙන්වීම මෙහි මූලික අපේක්ෂාවයි.




ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ විෂය සමගාමී, මාර්ගෝපදේශ හා උපදේශන ශාඛාව එක්ව මාර්ගගත තාක්ෂණය ඔස්සේ (Online) තාක්ෂණය මඟින් ක්‍රියාත්මක කළ මෙම වැඩසටහන මඟින් සක්‍රිය පුරවැසියන් ලෙස අනාගත නායකත්වය සඳහා සිය දායකත්වය ලබාදීමට පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් තුළ අභිප්‍රේරණයක් ඇති කිරීම සිදු කෙරිණි.



ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩල ප්‍රධානී සහ නියෝජ්‍ය මහලේකම් කුෂාණි රෝහණදීර මහත්මිය, පාර්ලිමේන්තුවේ සහකාර මහලේකම් ටිකිරි කේ. ජයතිලක මහතා සහ අධ්‍යක්ෂ ව්‍යවස්ථාදායක සේවා සහ සන්නිවේදන එච්. ඊ. ජනකාන්ත සිල්වා මහතා ඇතුළු සන්නිවේදන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් පැවති මෙම වැඩසටහන මඟින් අනාගත නායකත්වයට ප්‍රවේශයක් ලබාදෙමින් ප්‍රජාතන්ත්‍රවාදය, එහි ස්වරූපය, පාර්ලිමේන්තුවේ සම්ප්‍රදායන්, කාර්යභාරය, ව්‍යවස්ථාදායක ක්‍රියාවලිය සහ කාරක සභා ක්‍රමය පිළිබඳ මූලිකවම අවබෝධය ලබා දෙන ලදි.








# 1972 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව යටතේ ජාතික රාජ්‍ය සභාව



**2022 වර්ෂයේ දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදු කිරීමට බලාපොරොත්තු වන නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත් සමඟ මෙරට පෙර පැවති විවිධ වූ ආණ්ඩුක්‍රමයන් සහ ඒවායේ සුවිශේෂ ලක්ෂණ පිළිබඳව සංවාදයන් ඇරඹී තිබේ. ඉන් එකක් නම් "ජාතික රාජ්‍ය සභාව" පිළිබඳව කතාබහයි.**

1972 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව යටතේ මෙරටට ප්‍රථම වරට ජාතික රාජ්‍ය සභාව පිළිබඳ සංකල්පය හඳුන්වා දෙන ලදී. 1978 ව්‍යවස්ථාවට අඩිතාලම ද වූ 1972 ව්‍යවස්ථාවේ 4 වන වගන්තිය තුළ "ජනතාවගේ පරමාධිපත්‍ය ක්‍රියාත්මක වන්නේ තෝරා පත් කරනු ලබන ජනතා නියෝජිතයන්ගෙන් සමන්විත ජාතික රාජ්‍ය සභාව මඟිනි" යනුවෙන් සඳහන් වේ. එපමණක් නොව, 5 වන වගන්තිය මඟින් ව්‍යවස්ථාදායක, විධායක සහ අධිකරණ යන ත්‍රිවිධ බලතල ජාතික රාජ්‍ය සභාව වෙත ඒකරාශී කොට ක්‍රියාත්මක කරන බව ද වැඩිදුරටත් සඳහන් කර ඇත. එනම්, එයට පෙර පැවති විවිධ වූ ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණයන්ට වඩා වෙනස් මඟක් 1972 ජනරජ ව්‍යවස්ථාව ගෙන ඇත. සෝල්බරි හෝ පෙර තිබූ ව්‍යවස්ථාදායකයන් සතු නොවූ පාර්ලිමේන්තු පරමාධිපත්‍ය පිළිබඳ සංකල්පය 1972 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව මඟින් ජාතික රාජ්‍ය සභාව වෙත හිමි කර දී ඇත්තේ ය.

ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව මඟින් නිර්මිත ජාතික රාජ්‍ය සභාව ඒක මණ්ඩලීය ව්‍යවස්ථාදායකයකි (Unicameral Legislature ) එහි අටවැනි පරිච්ඡේදය (1972 ව්‍යවස්ථාවේ) ජාතික රාජ්‍ය සභාව පිළිබඳව අනාවරණය කරමින් මහා මැතිවරණයකින් පසුව රැස්වන පළමුවන රැස්වීමේ දී ම කටයුතු කළ යුතු ආකාරය විස්තර කරයි. මන්ත්‍රීවරුන් දිවුරුම් දීමෙන් අනතුරුව කථානායක, නියෝජ්‍ය කථානායක හා කාරක සභා සභාපති යන තනතුරු සඳහා මන්ත්‍රීවරු අතුරින් සුදුස්සන් තෝරා පත්කර ගත යුතු අන්දම 1978 ව්‍යවස්ථාවට බොහෝදුරට සමානකම් දරන්නේය.

1972 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව යටතේ ජාතික රාජ්‍ය සභාවේ නිල කාලය අවුරුදු 6 කි. එහි සැසිවාර වසරකට වරක්වත් ජනාධිපතිවරයා විසින් කැඳවිය යුතු විය. බටහිර ආණ්ඩුක්‍රමයන්හි අනුරූ නොව ලංකාවටම ආවේණික වූ ව්‍යවස්ථාවක් කෙටුම්පත් කිරීමේ ගමනේ මූලාරම්භය ලෙස සැලකිය හැකි 1972 ව්‍යවස්ථාවේ ද ජාතික රාජ්‍ය සභාව සතුව තිබූ නීති සම්පාදනය කිරීමේ බලය කැපී පෙනෙයි. ව්‍යවස්ථාව හෝ ව්‍යවස්ථාවෙන් කොටසක් පරිච්ඡින්න කිරීමේ බලය ද, සංශෝධනය කිරීමේ බලය හා ව්‍යවස්ථාව වෙනුවට නව ව්‍යවස්ථාවක් පැනවීමේ බලය ද මෙයට ඇතුළත් විය. එසේ වුව ද, හදිසි අවස්ථාවක් ප්‍රකාශයට පත්කොට ඇති විටෙක ජන ජීවිතය යහපත් අයුරින් පවත්වාගෙන යාම සඳහා අත්‍යවශ්‍ය දෑ හා සේවා සැපයීම සඳහා මහජන

ආරක්ෂාව පිළිබඳව තත් කාලයේ පවත්නා නීති වලට අනුකූලව නීති පැනවීමේ බලය ජාතික රාජ්‍ය සභාව විසින් ජනාධිපතිවරයාට පැවරිය හැකි බවට සඳහනක් ප්‍රථමවරට එහි විය. නමුත් මෙහි දී ජනාධිපතිවරයාට පවරා දෙනු ලබන බලයේ කිසිඳු නෛතික සීමාවක් ව්‍යවස්ථාවේ සඳහන්ව නොතිබීම ජාතික රාජ්‍ය සභාවේ ස්වාධිපත්‍ය සම්බන්ධයෙන් හානියක් වූවා යැයි ද උපකල්පනය කළ හැකි ය.


ජාතික රාජ්‍ය සභාව ව්‍යවස්ථාදායක බලය පමණක් නොව, විධායක හා අධිකරණ බලය ද පුළුල් ලෙස ඒකරාශී කරගත් ආයතනයක් විය. එසේ ම අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය ජාතික රාජ්‍ය සභාව තුළින් නිර්මාණය වූ හෙයින් එයට විධායක බලය භුක්ති විඳිය හැකි වූයේ ජාතික රාජ්‍ය සභාව අනුමැතිය ලබා දෙන තාක්කල් පමණක් විය. ජනතාවගේ අධිකරණ බලය නීතියෙන් ප්‍රතිෂ්ඨාපිත අධිකරණ ආයතන මාර්ගයෙන් ක්‍රියාත්මක කරන්නේ ද ජාතික රාජ්‍ය සභාවයි යනුවෙන් සඳහන් කර තිබීමෙන් ජාතික රාජ්‍ය සභාවට යම් අධිකරණ බලයක් ද ආරෝපණය කර ඇති බැව් පැහැදිලි ය.

ඒක මණ්ඩලීය ව්‍යවස්ථාදායකයක් වූ ජාතික රාජ්‍ය සභාව ප්‍රාදේශීය නියෝජනය මඟින් තෝරා ගත් නියෝජිතයන්ගෙන් සමන්විත විය. එවැනි තත්ත්වයක් යටතේ ජාතික රාජ්‍ය සභාව තුළ බහුතර බලයක් පවත්වාගෙන යාම පහසු නොවී ය. මන් ද මන්ත්‍රීවරුන්ට දේශපාලන පක්ෂ සමඟ බැඳී නොසිට ස්වාධීනව කටයුතු කිරීමට ඉඩකඩ ද එම ප්‍රාදේශීය නියෝජනය නිසා හිමි වුණු හෙයිනි.

ව්‍යවස්ථාව දේශීයකරණයේ ප්‍රථම පියවර වූ 1972 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව මෙරට ශක්තිමත් ආණ්ඩු ක්‍රමයක ඉතිහාසයේ අඩිතාලම බඳු ය. ජනතා සේවයට කැප වුණු, පක්ෂ දේශපාලනයට හෝ දේශපාලන ප්‍රතිරූප තෘප්තියට පත් කිරීම පසෙකලා ස්වයංපෝෂිත ශ්‍රී ලංකාවකට අවශ්‍ය වූ ආණ්ඩුක්‍රමයකට පන්නරය 1972 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව ලබා දුන් බව පිළිගත යුත්තකි.

**රංජනා රණසිංහ**
**පාර්ලිමේන්තු නිලධාරි**
**පනත් කෙටුම්පත් කාර්යාංශය**

# එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ව්‍යුහය සහ කාර්යභාරය



1943 වර්ෂයේ ඉරානයේ ටෙහෙරාන් නුවර රාජ්‍ය නායකයින් කිහිප දෙනෙකුගේ සහභාගිත්වයෙන් රැස්වීමක් පැවැත්වුණි. බ්‍රිතාන්‍ය අගමැති වින්සන්ට් චර්චිල්, ඇමරිකා එක්සත් ජනපදයේ ජනාධිපති ප්‍රෑන්ක්ලින් රූස්වෙල්ට් සහ සෝවියට් රුසියාවේ නායක ජෝසප් ස්ටාර්ලින් එම රැස්වීමට සහභාගී වූ නායකයින් විය. මෙහිදී පළමු සහ දෙවන ලෝක යුද්ධයෙන් පසු ලෝකයේ නැවත යුද්ධයක් ඇතිවීම වලක්වමින් ලෝක සාමය පවත්වාගෙන යාම වෙනුවෙන් ජගත් සංවිධානයක් පිහිටුවීමේ අවශ්‍යතාව සාකච්ඡා විය. මේ අනුව එහිදී විවිධ යෝජනා ඉදිරිපත් වූ අතර එම යෝජනා පදනම්කරගත් ප්‍රතිපත්ති මාලාවක් 1945 වර්ෂයේ සැන් ප්‍රැන්සිස්කෝ නුවර පැවැත් වූ සමුලුවකදී සකස් කර රටවල් 50ක් අනුමත කරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස 1945 ඔක්තෝම්බර් 24 වැනි දින ඇමරිකා එක්සත් ජනපදයේ නිවුයෝර්ක් නුවර මූලස්ථානය කර ගනිමින් ලොව ප්‍රධානතම ජාත්‍යන්තර සංවිධානයක් වන එක්සත් ජාතීන්ගේ සංවිධානය (UNITED NATIONS ORGANIZATION) ආරම්භ විය. එතැන් පටන් ඔක්තෝම්බර් 24 දින එක්සත් ජාතීන්ගේ දිනය ලෙස නම්කොට තිබේ.

ආරම්භයේ පටන්ම එක්සත් ජාතීන්ගේ සංවිධානය ලෝක සාමය සහ සුරක්ෂිතතාවය ස්ථාපිත කිරීම වෙනුවෙන් සාධනීය අයුරින් කටයුතු කරමින් සිටියි. මෙම සංවිධානයේ

ආයතන ව්‍යුහය ප්‍රධාන සංවිධාන 6 කින් සමන්විත වේ. එනම්,

01. මහා මණ්ඩලය
02. ආරක්ෂක මණ්ඩලය
03. ආර්ථික හා සමාජීය කටයුතු පිළිබඳ මණ්ඩලය
04. භාරකාර මණ්ඩලය
05. අන්තර් ජාතික අධිකරණය
06. මහලේකම් කාර්යාලය

එම සංවිධානයි.

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකත්වය දරන සියලු රටවල් මහා මණ්ඩලයට අයත් වේ. අවි සීමා කිරීම, නිරායුධකරණය, ජාත්‍යන්තර සාමය ආරක්ෂා කිරීම පිළිබඳ ප්‍රතිපත්ති සකස් කිරීම සහ නිර්දේශ නිකුත් කිරීම මහා මණ්ඩලයට අයත් කාර්යයන් කිහිපයකි. මහා මණ්ඩලය සෑම වසරකම සැප්තැම්බර් මාසයේදී ඇමරිකාවේ නිව්යෝර්ක් නුවර එක්සත් ජාතීන්ගේ ප්‍රධාන කාරයාලයේදී රැස් වේ.

ආරක්ෂක මණ්ඩලයේ සාමාජික සංඛ්‍යාව 15කි. එහෙත් මෙම මණ්ඩලයේ නිත්‍ය සාමාජිකත්වය ඇමෙරිකාව, එංගලන්තය, ප්‍රංශය, රුසියාව හා චීනය යන රටවල්වලට හිමි වේ. එසේම ඔවුන්ට නිශේධ බලය හිමිවීම විශේෂත්වයකි. එනම් යම් යෝජනාවකට සාමාජිකයින් 4දෙනෙකු පක්ෂව සිටියද එක් සාමාජිකයෙක් එම යෝජනාවට විරුද්ධව සිය ඡන්දය භාවිත කිරීමේදී එම යෝජනාව පරාජයට පත් වේ. එසේම මෙහි සිටින අනෙකුත් සාමාජිකයින් 10 දෙනා වසර දෙකක් සඳහා පත් වේ.

ආර්ථික හා සමාජීය කටයුතු පිළිබඳ මණ්ඩලයට එක්සත් ජාතීන්ගේ සංවිධානය සතු විශේෂඥ මණ්ඩලවල දැනුම ඒකාබද්ධව යොදා ගනියි. ලෝකයටම වැදගත්වන ආර්ථික සහ සමාජීය කරුණු පිළිබඳ ලෝකවාසීන් දැනුවත් කිරීම මෙමඟින් සිදු වේ.

භාරකාර මණ්ඩලයේ කාරයභාරය වන්නේ එක්සත් ජාතීන් භාරකාර ක්‍රමයට ගත් ප්‍රදේශ පාලනය කිරීමයි. අන්තර් ජාතික අධිකරණයේ මූලස්ථානය පිහිටා ඇත්තේ නෙදර්ලන්තයේ හේග් නුවරයි. ඕනෑම රාජ්‍යකට තම ආරවුල් පිළිබඳ අන්තර්ජාතික අධිකරණයට කරුණු ඉදිරිපත් කිරීමට හැකිය.


මහලේකම් කාර්යාලයෙහි ප්‍රධානියා වන්නේ මහලේකම්වරයායි. වර්තමානයේ මහලේකම්වරයා වන්නේ ඇන්ටෝන්යෝ ගුටරෙස් මහතායි. ඔහු සියලුම ආයතනවල පරිපාලන නිලධාරියා වන අතර මහ බලවතුන්ගේ එකඟත්වයෙන් ඔහු පත් කරයි. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රධානම කාර්යය වන්නේ ලෝක සාමය ආරක්ෂා කිරීමයි. ඔවුන් ඒ සඳහා වර්තමානයේ විවිධ ක්‍රියාමාර්ග ගනිමින් සිටියි එහිදී පරමානුක බලශක්තිය පාලනය කිරීම වෙනුවෙන් කටයුතු කිරීම වැදගත් කරුණකි. එසේම වර්තමානයේ විවිධ රටවල මානව හිමිකම් කඩවීම්, විවිධ දේශපාලනික ගැටලු ආදිය වෙනුවෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානය මැදිහත් වී විසඳුම් ලබාදීමට ක්‍රියාකරමින් සිටියි. තවද වර්තමාන ලෝකය හමුවේ තිරසර අභිමතාර්ථ 17 ක් ඉදිරිපත් කරමින් 2030 වසර වන විට ඒවා ඉටුකරගැනීම වෙනුවෙන් කටයුතු කරමින් සිටියි.

**ආසිරි හපුගොඩ**
**මාධ්‍ය නිලධාරී**
**සන්නිවේදන දෙපාර්තමේන්තුව**



# පාර්ලිමේන්තුව සැකෙවින්...

## ජුනි 2022



මෙවර සටහන - **එච්. ඊ. ජනකාන්ත සිල්වා** - අධ්‍යක්ෂ (ව්‍යවස්ථාදායක සේවා)/ අධ්‍යක්ෂ (සන්නිවේදන) (වැඩබලන)

**ජුනි 07**

- පාර්ලිමේන්තුවට පිළිගන්වනු ලබන වාර්ෂික වාර්තා, කාර්ය සාධන වාර්තා ඇතුළු අනෙකුත් වාර්තා ඉදිරියේදී මෘදුකාංග පිටපත්වලින් (Soft Copies) ප්‍රකාශය පත් කරන බවත්, ඒවා පාර්ලිමේන්තුවේ නිල වෙබ් අඩවියට උඩුගත කරනු ලබන බවත්, කථානායකවරයා විසින් නිවේදනය කිරීම.
- අග්‍රාමාත්‍ය සහ මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මහතා විසින් රටේ වත්මන් ආර්ථික තත්ත්වය පිළිබඳව විශේෂ ප්‍රකාශයක් සිදු කිරීම.
- පාර්ලිමේන්තු මන්ත්‍රී, ගරු විජයදාස රාජපක්ෂ මහතා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද විසිදෙවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කිරීම සඳහා වූ පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත එතුමා විසින් ඉල්ලා අස්කර ගනු ලැබීම.

**ජුනි 08**

- අත්‍යවශ්‍ය රාජ්‍ය සේවාවන් බාධාවකින් තොරව පවත්වා ගෙන යාමට අවශ්‍ය අරමුදල් සපයා ගැනීම සඳහා රුපියල් බිලියන 695ක පරිපූරක ඇස්තමේන්තුවක් පාර්ලිමේන්තුව විසින් අනුමත කිරීම.


**ජුනි 09**

- පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා සිය පාර්ලිමේන්තු මන්ත්‍රී ධූරයෙන් ඉල්ලා අස්වීමේ ලිපිය පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාට භාරදීම.
- 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත සංශෝධනය කිරීම සඳහා වූ ශ්‍රී ලංකා විදුලි බල (සංශෝධන) පනත් කෙටුම්පත අද පාර්ලිමේන්තුවේදී වැඩි ඡන්දයෙන් සංශෝධන රහිතව සම්මත වීම.

**ජුනි 10**

- අනපේක්ෂිතව ඝාතනයට ලක්වූ පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු අමරකීර්ති අතුකෝරළ මහතා පිළිබඳ ශෝක ප්‍රකාශ යෝජනාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.

**පාර්ලිමේන්තුව සැකෙවින්...**



# ජූනි 2022

## ජූනි 15

- කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා විසින් 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත සංශෝධනය කිරීම සඳහා වූ ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පතට 2022 අංක 16 දරන පනත වශයෙන් සිය සහතිකය සටහන් කිරීම.

## ජූනි 21

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ අභියෝගයට ලක් කරන ලද, පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු රංජිත් මද්දුම බණ්ඩාර මහතා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද "විසි එක් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය" නමැති පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා විසින් පාර්ලිමේන්තුවට නිවේදනය කිරීම.

- 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කිරීමට අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.

- කාර්මික ආරවුල් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත සංශෝධන සහිතවද, අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) සහ සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත් විවාද කිරීමකින් තොරව ද, පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබීම.

## ජූනි 22

- හිටපු අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මහතා ඉල්ලා අස්වීමෙන් ඇති වූ මන්ත්‍රී පුරප්පාඩුව සඳහා තේරී පත්වූ ධම්මික පෙරේරා මහතා විසින් සිය මන්ත්‍රී ධුරයේ ප්‍රතිඥා දෙනු ලැබීම.

- මැතිවරණ සහ ඡන්ද විමසීම් ව්‍යුහයේ හා නීති රීතිවල ප්‍රතිසංස්කරණ හඳුනාගැනීමටත්, ඒ සම්බන්ධයෙන් අවශ්‍ය සංශෝධන ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේ අවසන් වාර්තාව එම කාරක සභාවේ සභාපති පාර්ලිමේන්තුවේ සභානායක, අමාත්‍ය ගරු දිනේෂ් ගුණවර්ධන මහතා විසින් පාර්ලිමේන්තුට සභාගතකරනු ලැබීම.

## ජූනි 23

- සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන), කාර්මික ආරවුල් (විශේෂ විධිවිධාන), අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) සහ සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත් පිළිවෙළින් 2022 අංක 17, 18 සහ 19 පනත් වශයෙන් කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා විසින් සහතිකය සටහන් කරනු ලැබීම.

## ජූනි 30

- පවතින දුෂ්කරතා හේතුවෙන් පාර්ලිමේන්තු රැස්වීම් නොපැවැත්වෙන දිනවලදී කාරක සභා රැස්වීම් මාර්ගගත තාක්ෂණය ඔස්සේ (Online) පැවැත්වීමට අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට තීරණය කිරීම.

## ඡායා ගැලරිය

## පාර්ලිමේන්තු වාර්තාකරණයේ යෙදෙන මාධ්‍යවේදීන් සඳහා පාර්ලිමේන්තු ක්‍රමවේදය පිළිබඳ එක්දින වැඩමුලුවේ විශේෂ අවස්ථා...



# පාර්ලිමේන්තු විත්ති


පුවත් හසුන I 24 වැනි කාණ්ඩය I ජුනි 2022

ISSN 2806 – 5425



සන්නිවේදන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

දුරකථනය : +94 11 2777100 ෆැක්ස් : +94 11 2777227

www.parliament.lk

Parliament of Sri Lanka

@ParliamentLK

@slparliament

Parliament of Sri Lanka